# SULU RĀJA WALIYA,

*A Historical narrative of the*

DYNASTY OF KINGS

**From Vijaya the first King of Ceylon to**

**Sri wikrama rajasingha**

*COMPILED BY*

**A LEARNEDAUTHOR.**

PRINTED BY

C. D, S, K, Jayawardana,

*AT THE*

**WIDYALOKA PRESS, BUTHGAMUWA,**

# සුළු රාජාවලිය.

ලංකාවේ පළමුවෙන් රජකමට පත්වූ විජය රජ්ජුරුපටන්

ශ්‍රී වික්‍රම රාජසිංහ රජ්ජුරුදක්වා

**ර ජ පි ළි වෙ ළ ග ළ පා**

**ගෞරවාර්හ උගතෙකු විසින්**

පුරාණ මිශ්‍ර සිංහලභාෂාවෙන් රචනා කරනලද්දකි.

අධුනාකාල සිංහල ජනතාවගේ

ප්‍ර යෝ ජ න ය ස ඳ හා

**මහබුත්ගමුවේ සී. ඩී. ඇස්. කේ. ජයවර්ධන**

න මැ ති මා වි සි න්

**බුත්ගමුවේ, විද්‍යාලෝක මුද්‍රණ යන්ත්‍රාලයෙහි**

මු ද්‍ර ණ ය ක ර ව න ල දී.

**1914.**

National Library & Documentation Centre

# විඥාපනය.

## සූළු රාජවලිය.

මේ පොත ස්වරූපයෙන් විසාල නොවනනමුත් මෙහි ඇතුළත් කර තිබෙන වැදගත් කරුණු වශයෙන් සිතා බලනකල විසාල පොතක්වශයෙන් පෙණෙයි.

මේ ලඞ්කාවීපයෙහි පළමුවෙන් රජකමට පත්වූ විජයරජහුගේ කාලයෙහි පටන් අන්තිම රජවූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලය දක්වා කලින්කල ලඞ්කාවීපයේ රජකමට පත්වූ රජවරුන්ගේ නාමයන් සඳහන්කොට රාජපරම්පරා පිළිවෙළක් මෙහි දක්වා තිබේ, සමහර රජුන් සම්බන්ධව නොයෙක් කාලයන්හි ඇතිවූ බොහෝ බැරැරුම් යුද්ධතොරතුරුආදිය තත්වූ පරිද්දෙන් මහාවංසාදියෙහි මෙන් මෙහි දක්වා නැත්තේයි, සමහර රජුන්ගේ නාමයන් සඳහන් කොට රජකම්කල අවුරුදු ගණන නියමකොට දක්වා තිබෙනුමිස පැවැත්තු ක්‍රියා විසෙසාදි යම්කිසි තොරතුරක් වැඩිවශයෙන් දක්වා නැත්තේයි, එහෙයින් හැඟෙන්නේ රජවරුන්ගේ නාම සඞ්ඛ්‍යාව යුහුසුළුව ගනන්බලාගැනීම ප්‍රධාන අදහසක්වශයෙන් යොදා මේ පොත සම්පාදනය කරතීබෙන බවයි.

තවද බොහෝ රජවරුන්ගේ ක්‍රියා විසෙසාදි තොරතුරු බොහෝ සෙයින් නොදක්වා නාම මාත්‍රය පමණක් දක්වා තිබෙන හෙයින්ද යථොක්ත අදහස වැඩිදුර ප්‍රකාශවෙයි.

එක කාලයෙහිම දුරබැහැර ප්‍රදෙශවල දෙතුන්දෙනා රජකම් කළබවද ප්‍රකට නුමුත් වෙන්වෙන් වශයෙන් ඒඒ රජුන්ගේ ගණනා යටකී පිළිවෙළේ රජුන්ගේ ගණනට එකතුකර ගණන් නොගත් බව පෙණේ.

සම්බුද්ධදෙශනාවෙහි පෙණෙනා පරිද්දෙන් පුණ්‍ය සම්භාරයක් ලබාගන්නාපිණිස සමහර ශ්‍රද්ධාවන්ත රජවරුවිසින් මහත් වස්තු පරිත්‍යාගයෙන් කරවා තිබෙන මාහැඟි විහාරාරාම චෛත්‍යාදියේ අගය වර්ණණාවද සමහර තැන්වලදී සංක්ෂෙපවශයෙන් දක්වා තිබේ, එසේ කරතිබෙන්නේත් පොතේ ස්වරූපය කුඩා කරගන්නා පිණිසයයි සිතිය යුතුව තිබේ.

ඒ කෙසේ වූවත් මේ සුළු කුඩාපොත ආදරසහිතව නුවන් යොමු කර බලන කියන කාටත් මහත් ප්‍රීතියක් ලැබෙනවා ඇ.ති.

(තවද සූළුරාජවලිය නම්වූ) මේ කුඩාප්‍රකරණය කවරෙක් විසින් කවරකලෙක සාදන ලද්දේදැයි යනු පරීක්ෂා කටයුතු සුදුසු කරුනකි, මෙහි කර්තෘ කව්රෙක්දැයි නිශ්චයකිරීම දුෂ්කර කරුනක්ව තිබේ. ඒ මක්නිසාදැයි යතහොත් මේ සුළුරාජවලියෙහි හෝ වෙන යම් කිසි පොතක පතක හෝ සඳහන් කිරීමක් දකින්ට නොලැබුන බැවින් සුදුස්සන්ගෙන් අසාබලා සෙව්නමුත් නිශ්චය වශයෙන් දැන ගන්ට නොලැබුනේයි, ඒ එසේ විනාමුත් වැලිවිට සරණඞ්කාරාභිධාන සඞ්ඝරාජමහා සථවිර ස්වාමිපාදයන් වහන්සේගේ අන්තේවාසික උගත් ශිෂ්‍යයෙක් විසින් සාදන ලදැයි මුඛමාත්‍ර භාෂනයක් අසන්ට ලැබුනේයි, එසේ වුවත් එපමනකින් නිශ්චය කිරීම අයෝග්‍යබැවින් ඒ මුඛමාත්‍ර ශෘතිය බහා තැබුයෙමි.

මෙහි කාලය සඳහා නිශ්චයවශයෙන්ම කියන්ට පුළුවන්ව තිබෙන්නේ මේ දිවයිනේ රජවූ රජවරුන්ගෙන් අන්තිම රජවූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජ්ජුරුගේ කාලයෙහි බවයි. එකීම නිසැකයෙන්ම පිළිගැණීම නිවැරදිබව කාවිසිනුත් ඒත්තු ගතයුතුයි.

සාමාන්‍යයෙන් දුප්පත්වැසියන්ගේ ඉගෙණීමට සුදුසුයයි සල කා මේ කුඩා ප්‍රකරණය ලිපිදෝෂාදිය පහකොට මුද්‍රණය කරවා පතල කරන්ට අදහස් ඇතිවූ බැවින් උඩපාත දෙරටින් පොත් තුණ හතරක් සොයා ගන්ට තැත්කල නමුත් ඒ නුපුළුවන්විය, එසේවූයේ මේපොත කොයිපලාත්වලත් බහුල වශයෙන් නොමැති බැවිනි.

එකපොතකින් පිටපතක් ලියාගෙණ නොයෙක් වර කියා බල මින් අව්‍යක්ත ලිපිකරුවන්ගෙන් යෙදීතිබුන ඕලාරික දෝෂ පහ කොට අපගේ ආචාර්‍ය්‍ය ගෞරවාහී මහසථවිරපාදයන්වහන්සේට පෙන්නා උන්වහන්සේගේ අනුමතය සහ උපදෙශද ඇතිව අවකාශ ඇතිවූ පරිද්දෙන් ශක්ති පමනින් වරදහැරියෙමි, එසේ උවත් තව අවශේෂ වරද නැතැයි නොසිතමි.

තත්සම තද්භව රූඪි වශයෙන් අපේ සිංහල භාෂාවට යෙදී තිබෙන වචනයන්ගේ අර්ථ සිතා ගැණීම දුෂ්කර නොවන නමුත් පුරාණ ව්‍යවහාර බොහෝ වචනයන්ගේ පදාර්ථ භාවාර්ථ නිශ්චය වශයෙන් සිතාගැම්ම ඉතා දුෂ්කරව තිබේ.

මෙම සුළුරාජවලියෙහි 8 වෙනි පිටේ 70 වෙනි අංකයේ“ මිත් සෙන්නම් කරල්සොරෙක් රජය ලදින්” යනමේ පාඨය තිබේ, මේ පාඨය සිතාබැලියයුතුයි “මිත්සෙන්නම්” යනු මිත්‍රසේනනාම්” යයි සිතිය හැකිවෙයි “කරල්සොරෙක්” යනු හැල් (වී) කරල් සොරකම්

කළ වෛරයෙක්යයි කියන්ට පුළුවනි, නවත් ක්‍රමයකින් කෲරසිත් ඇති රළුස්වර ඇත්තෙක් යයි කියන්ටත් පුළුවනි, මෙයද නිශ්චයකළ නොහැකියි.

භාවාර්ථය උපුටාගන්ට බැරි නවත් බොහෝ වචන එහි ඇත්තේයි, මෙබඳු වචන සිතෙහි තබාගෙණ සිහි කිරීමෙන් හා සුදුස්සන් පිළිවිසීමෙන්ද කලකදී තේරුම්ගන්ට පුළුවන්වීමද ලෝකස්වභාව අනුගතයි.

ගම්බද සිංහලපාඨශාලාවල ශිෂ්‍යයන්ගේ ප්‍රමාණයට සුදුසු වශයෙන් මේ සුළුපොත උගන්වන්ට හොඳබවද එසේම පාඨශාලා ශිෂ්‍යයන්ගෙන් උගත් ප්‍රමාණය පරීක්ෂාකරන්ට යොදාදෙන ප්‍රශ්නපත්‍රවලට මේ පොතෙන් සුදුසු උදාහරණ යොදා ලීමද හොඳයයි හැඟේ.

තවද මුද්‍රණය කරවන පොත් එක වරටම විශේෂ ශුද්ධියට පැමිනවීම කවරෙකුට නමුත් ඉතා අමාරු වැඩකි, එහෙයින් මෙහිද යම්යම් දෙස් යටපත්වී තිබෙන්ට පුළුවනි, එබැවින් මේ සුළුපොත බලන කියන නැනවතුන්ට යම්යම් තැන්වල වරදක් පෙණුනේනම් ලෝකානුකම්පාවශයෙන් ඒ ඒ තැන් සඳහන්කර ලියාඑව්වොත් ඉතා සතුටින් බාරගෙණ නැවත මේ (පොත) මුද්‍රණය කරවන කලෙක සුදුසු විධියකින් සොදා දක්වනබැව්ද මෙයින් නිවේදනය කරමි.

මේවග මෙසේ නිවේදනය කරන්ට සෙදුනේ මේ මුද්‍රණයෙහි අයිතිකාරයාවන මෙහි අත්සන යෙදූ මහබුන්ගමුවේ **සී. ඩී. ඈස්. කේ. ජයවර්ධන** වන මවිසින්ය.

නැවත නැවත මේ පොත මුද්‍රණකරවීමේ අයිතිය නීතිනියෝග පරිද්දෙන් මෙහි අත්සන් කළ මගේමයයි සියළු දෙනාවිසින්ම ඒත්තුගතයුතුයි.

මේවගට,

**සී. ඩී. ඈස්. කේ. ජයවර්ධන.**

# සූළුරාජවලිය.

## නමො බුද්ධාය.

සබ්බලොකහිතං පත්වා, කත්වා සන්තිං ඨානං පරං
පරිනිබ්බාණ මංචම්හි, නිපන්නො ලොකනායකො.

දෙවතා සන්නිපාතම්හි, මහන්තම්හි මහාමුනි
සක්කං තත්‍ර සමීපට්ඨං, අවොච වදතං වරො.

විජයො ලාළවිසයා, සීහබාහු නරින්දජො
එස ලංකමනුප්පත්තො, සත්තාබච්චසතානුගො.

පතිට්ඨිස්සති දෙවින්ද, ලඞ්කායං මම සාසනං
තස්මා සපරිවාරන්තං, රක්ඛලඞ්කඤ්ච සාධුකං.

තථාගතස්ස දෙවින්දො, වචො සුත්වා විසාරදෙ
දෙවස්සුප්පලවණ්ණස්ස, ලඞ්කාරක්ඛං සමප්පයි.

යනාදීන් වදාළ බැවින් පෙර කලිඟු රජහු දූ වඟුරට වඟු රජහු කෙණෙර් වැස දුවක ලද, ඕ වැඩී කිසියම් අකුසලයකින් එකලාව වල් ගොස් අතරමග සිංහයක්හට හසුව ඔහු කෙරේ වැස සිංහබාහුය සිංහවල්ලීයයි පුතකු හා දුවකු ලද, පසුව සිංහබාහුරජ සිංහවල්ලීනම් තමාගේ නගාම බිසෝකොට ලාඩරට
1. රජකොට විසීය, මොවුන් දෙදෙනා දරු විජයරජකුමර අප බුදුන් පිරිණිවන්පානා දවස් සක්දෙව්රජහුගෙන් අරගෙ ලදින් සත්සියයක් යොධයන් ගෙණ මෙම ලක්දිව තමමන්නාදිවයින් බැස කුවේනීනම් යකින්නගේ සහායෙන් යක්ෂයන් මරා එහු බැඳඑමතමමන්නාවෙහි නුවරක් කරවා එහි අටතිස් අවුරුද්දක්
2. රජකෙළේය. පසුව ඔහුගේ උපතිස්සනම් අමාත්‍යයෙක් රාජ්‍යය කිරීමට නිසිකෙනෙක් අවිද්‍යමාන හෙයින් තෙමේ
3. එහිම අවුරුද්දක් රජකොට, දඹදිව්යවා විජයරාජයන් භාතෘ පිත් පණ්ඩුවාසරජහු ගෙන්වා ඇලසර තමාකැරවූ උපතිස්ස නම් නුවර ලා තිස්අවුරුද්දක් ඇතුළත රජකරවිය.
4. ඒ පඬුවස් රජ්ජුරුවන්ගේ මහළුපිත් අභයනම්රජ විසි අවුරුද්දක් රජකෙළේය.

5. එ රජහුගේ බෑනාවන කුමාරයෙක් දෙවන පණ්ඩුකාභය නම් රජව අනුරාධපුරනුවර ශ්‍රීමහාබොධිස්ථානයට උත්තර දිසාභාගයෙහි සතරගව් පමන අයම්විතරින්හා සොළොස්ගව් පමනතැන් වටින් ගෙණ දිව්‍යපුරයක්සේ මුල්පිස කරවා හයා වැව බඳවා සැත්තෑ අවුරුද්දක් රජකෙළේය.

6. ඔහුපිත් මූටසීවනම් රජ මහමෙවුනා උයන කරවා සැට අවුරුද්දක් රජය කෙළේය.

එකලට අපබුදුන් පිරිනිවි දෙසියසතිස් අවුරුද්දක් ගියේය.

7. එකල මුටසිව රජහුපිත් දෙවෙනිපැතිස්ස නම් රජෙක් රජවිය. ඒ රජ්ජුරුවෝ මිහිඳුමාහිමියන් වහන්සේගේ අනුශාසනාවූ පරිද්දෙන් ලෝවැඩ සසුන් වැඩ කරන්නාහු දක්‍ෂිණ ශ්‍රීමහාබෝධීන්වහන්සෙ ගෙන්වා අනුරාධපුරයෙහි පිහිටුවා බුදුන්ගේ දකුණු අකුධාතුන්වහන්සේ පිහිටුවා ථූපාරාම දාගැබ බඳවා අප බුදුන් කුසරජකල සක්දෙව්රජහු විසින් දෙනලද අඞවංක මාණික්‍ය රතනය පරම්පරාවෙන් පැවතඅවුත් ධර්‍මාසොක රජ හසනගතවූ කල්හී එරජ බුදුන් බෝසත්කල පාරිභොගිකා ධාතු යයි සිතා එහි බුදුන්ගේ ඌර්ණරොම ධාතුව වඩා පූජාකරණ කල්හි මිහිඳුමහතෙරුන්වහන්සේ ලක්දිව් වඩනා දවස් ඌර්ණරොමධාතුව හා මාණික්‍යරතනය ගෙණවුත් සෑගිරිපර්වතයෙහි කිසිවක්හුවිසින් නොගතහැකි සේ ඉටා නිධානකරවූ සේක.

8. අනිකුදු පාත්‍රයක් පමණ ශාරීරිකධාතු ගෙන්වා ලඞකාවීපයෙහි යොදුනකට දාගැබක් සඞඝාරාමයක් බැගින් සවාසු දහසක් දාගැප්හා සවාසු දහසක් සඞඝාරාමකරවා තිසාවැවබඳවා බොහෝ භික්‍ෂූන්වහන්සේ ඇතිකරවා චිවරාදී සිවුපසයෙන් උපස්ථාන කොට ශාසනෝපකාරිව ලෝවැඩ සසුන්වැඩ කෙරෙමින් සතළිස් අවුරුද්දක් රාජ්ජ්‍යයකොට දෙව්ලොව ගියේය.

9. ඔහුමල් උත්තියනම්රජ දසඅවුරුද්දක් රාජ්ජ්‍යය කෙළේය.
10. ඔහු මල් මහාසීවනම් රජ දස හවුරුද්දක් රාජ්ජ්‍යය කෙළේය.
11. ඔහුමල් සුරතිස්සරජ නිල්ගිරිවෙහෙරආදී පන්සියයක් විහාර කරවා ලෝවැඩ සසුන්වැඩකොට දසඅවුරුද්දක් රජකෙළේය.

12. ඔහු ඉක්බිති ලක්දිවට අසුන් ගෙණා අසවාචාරි දෙබෑ
13. කෙණෙක් දෙවිසිඅවුරුද්දක් රජකළහ. මේ දෙමළුන් දෙදෙනා
මරා එහුබෑඳ එම දෙවෙනිපැතිස්සරජහු මල් අසේලනම් රජ
14. දසඅවුරුද්දක් රජකරන කල, සොලීරටින් එළාලනම් දෙමළ
රජෙක් ලක්දිව් බැස අනුරාධපුර නුවර ගෙණ අසේල රජහු
මරා රුහුණහැර ලක්දිව් මුළුල්ලෙහි ලෝසසුන් නසා දෙතිස්

දෙමළ කදවුරක් ඇතිකොට විසිමහා යෝධකෙනෙකුන් ඇතිව සූසාළිස් අවුරුද්දක් රාජ්‍යය කෙළේය.

15. යටකී දෙවෙනිපැතිස් රජහු මල් මහානාග රජ තමාට විෂයෙන්‍යෙදූ අඹ එවූහයි බැදැ බිසවුන් කෙරේ කලකිරී බැහැනන් රාජ්‍යය කරණ සමයෙහි රුහුණගොස් රජකොට යටාල තිසුන් ලදහ, ඒ යටාලතිස් රජ කැලණිපහය ඇතුළු කැලණි වෙහෙර කරවා එහිම රජකෙළේය.

16. ඔහුපින් ගොළුඅබානම් රජ රුහුණගොස් රජ කළේය.

17. ඔහුපින් කාවන්තිස්සරජ කැලණිවෙහෙර තිස්සමහා වෙහෙර දෙමටමල් සිතුල්පව් ආදිවූ සූසැටක් විහාරකරවා මහත්වූ පූජාකොට කැලණිතිස්රජහු දූ වෙහෙර නම්ලද බිසව අග බිසෝ කොට දුටුගැමුනු කුමරු හා සැදූතිස් කුමරුහා දරු දෙදෙනා ලදින් රුහුන හිදම සූසැට අවුරුද්දක් රාජ්‍යය කොට දෙව්ලොව ගියේය.

18. ඔහුපින් දුටුගැමුනු මහාරජ පියරජහු ඇවැමෙහි ලංකාවීපයෙහි දෙතිස් දෙමළ කදවුරුබැඳ වෙහෙර සසුන් නසා ලක් දිව්පුරා උන් දෙමළමහසෙන් දූක බුද්ධශාසණයෙහි උපන් මහා කරුණාවෙන් පරසතුරන් සාදා ලක්දිව සසුන් හෙලිකළ දව සෙකමුන් දෙපයද දිගුකොට වැදනොහෙම් එකොලොස්දහස් එක්සිය දසමහා යෝධයන්ගෙණ කඩොල්නම් ඇත්රජහු පැන නැගී රුහුණු රජසෙන් ගෙණ නික්ම දෙතිස් දෙමළ කදවුරෙහි දෙතිස් දෙතිස් දහස් බැගින් ඇණිලා හුන් දසලක්‍ෂ සූවිසි දහසක් පමන දෙමළුන් මරා එලාල රජහුද මරා අනුරාධපුර නුවර ගෙණ ඔටුනු පැලඳ සූවිසිහවුරුද්දක් දශරාජධර්‍මයෙන් රජකරනුයේ නවානූදහසක්පමන රජමහවිහාරකරවා එකුන් සියයක් පමන මහාපූජාකොට මෛතේ බුදුන්ට අගසව් වෙම් පතා තුසීපුරම ඉපිදගියේය.

19. ඔහු මල් සැදැතිස්රජ දිගානබාදීවූ වෙහෙර කරවා එහි සත්රුවන් දූලින් වසා සඞ්සඞ්යෙහි රථසක් පමන රන්පියුම් පුදා සවාසූදහසක් ධර්‍මසකන්ධයට සවාසූදහසක් පූජාකොට අටලොස් හවුරුද්දක් රාජ්‍යය කොට තුසීපුරම ගියේය.

20. ඔහුපිත් තුලනම්රජ ලෝදරා වෙහෙර කරවා එක්මස් දසදවසක් රාජ්‍යය කෙළේය.

21. ඔහුමරා ලැමැනිතිස්සනම් රජ ලක්‍ෂගණන් ධන වියදමින් තුඹරුක්වෙහෙර ආදිවූ තුන්වෙහෙරක් කරවා රුවන්දගැබට පවුරක් කරවා ලෝවැඩ සසුන්වැඩ කොට නවඅවුරුද්දක් රජ කෙළේය.

22. ඔහුමල් කල්ලාට තිස්සරජ ලෝවාමහාපායට ඉතා යහපත් දෙතිස්පායක් කරවා රුවන්වැලි දාගැබට පවුරක් කරවා සහ වුරුද්දක් දැහැමෙන් රාජ්‍යය කෙළේය.

23. ඔහුමල් වලගම්බාරජ බුදුන් පිරිනිවි සාරසිය එකුන්සාළිස් අවු
රුදු නවමස් දසදවසක් ගියපසු මෙලක රජපැමිණියේය.
24. එරජ පස්මසක් රජකරණකල සොළිරටින් දෙමළුසද්දෙනෙක් සත්සෙනඟක්ගෙණ සත්තොටකින් ලක්දිව්බැස ඔහු ළුහුබඳවා රාජ්‍යයගෙණ එකෙක් පාත්‍රාධාතුව ගෙණගිය, එකෙක් රජුගේ සොමිනම් බිසවු ගෙණගියේය. සිටිදෙමළු පස්දෙන පිළිවෙළින් තුදුස් හවුරුදු සත්මසක් රාජ්‍යයකොට සිටිකල වලගම්බාරජ මායාරජයේ හිඳ බලපිරිස් ගෙණ ගොස් නුවරවැද ඒ දෙමළුන් මරා රජය ගෙණ ලංකාවීපයෙහි ගල්ලෙන්වල පෙර තමාවසන කල ප්‍රයෝජනදක කටාරම්කොටවා දොළොස්අවිරුදු පස්මසක් රාජ්‍යය කෙළේය.

බැමිනිටීයා සායත් මොහු සමයෙහිම විය. මොවුන් දවස පන්සියයක් රහතන්වහන්සේ අළුලෙන වැඩහිඳ පොත් සඞගායනා කළසේක.

25. පෙරකී කළුන්නා රජහුපිත් මහඳලියා තිස්කුමර තුදුස් හවුරුද්දක් රජකෙළේය.

26. පසුව වලගම්බා රජහුපිත් චෝරනාගරජ අටලොස් මහ වෙහෙරක් මුලිනුපුටා නසා බොහෝ පව්පුරා දොළොස්අවුරුද් දක් අධම්මයෙන් රාජ්‍යයකොට පසුව ලක්දිව්වැස්සන් විසින් නසනාලදුව ලෝහැඳිරි නරකයෙහි කාලකංජකනම් මහා ප්‍රේතව මෙකප මුළුල්ලෙහිම ප්‍රේතදුකට භාජනවිය.

27. ඔහු ඉක්බිතිව මහඳලියා රජහු පිත් කුඩාතිස්නම්රජ තුන් අවිරුද්දක් රජකෙළේය.

28. ඔහු අඹු අනුලානම් බිසව එරජුට වසදී මරා බලත්සිවුවා ලවා
29. එක්අවුරුදු දෙමසක් රජකැරවුව. ඔහු වසදී මරා වටුකනම්
30. දෙමළෙකු ලවා එක්හවුරුදු දෙමසක් රජකැරවුව. ඔහු වසදී
මරා දරභතිකයා ලවා එක්හවුරුදු මසක් රජය කැරවුව.
31. ඔහු වසදී මරා පොරෝහිත බමුණාලවා සමසක් රජකැරවුව.
32. ඔහු වසදීමරා වාසුබිනම් නැකැත්තා ලවා එක්හවුරුදු මසක්
33. රජය කැරවුව. ඔහු වසදිමරා තොමෝ සාරමසක් රජකළාය.
34. පෙරකී සූර්‍ය්‍යවංශයෙන් ආ කුඩාතිස් මහරජහුපිත් මකලන්තිස්
රජපිත් තමා පියානන්ට වසදීමැරූ බිසව මරා දෙවිසිඅවුරුද්
35. දක් රජකෙළේය. ඔහුපිත් භාතියනම්රජ රුවන්වැලි දාගැබ
ඇතුළත රහතන්වහන්සේ පිරිත් බණන හඬඅසා ඇතුළට වැද

බණඅසාමුත් නොනැගෙමියි නිරාහාරව ශලපතරේ වැදහෙව ශක්‍රභවනය කම්පාකොට ශක්‍රයාගෙන්වා ඔහුගේ සහායෙන් ධාතුගර්භයට වැද බලාසිට තමා දාගැබ කුසදුටුවූනාක් ප්‍රතිමාරූප මණ්ඩපයක් කරවා රුවන්වැලි දාගැබට නොයෙක් වාරයෙහි පූජාකොට අටවිසි අවුරුද්දක් දැහැමෙන් රජකෙළේය.

36 ඔහුමල් මාදලියාමානාරජ සැගිරියේ ඇඹුළු දාගැබ කරවා ධාතුපූජාකොට කොලොම්හොය සිට පාදෙව පියවිලිපිටින්ගොස් සැගිරිය වදනාලෙස අලංකාර කොට ලක්දිව්වාසීන් දෙන අය නොගෙණ අනුරාධපුරනුවරට සතරදිගින් සතර සතර ගවු තැන් උයන් කරවා එහි සීනිද්ද බොලිද්ද දැසමන් සපු නා දෙඹ දුනුකේ වැටකේ ආදිවූ සුවඳ මල්වතු කරවා තමන් කරවූ සැගිරි දාගැබහා රුවන්වැලිදාගැබහා දෙක වටා කීලහිඳුවා සුවඳ මල් කොනඅග සලා දාගැබ නොපෙණෙන නෙක් මල්වරුවෙන් වසා මෙසේ මහත්වූ පූජාවක් කොට සියක්යොදුන් ලංකාද්වීපය සිසාරා ලක්දිව මැදපටන් මුහුදුපිට යොදුනක් පමණ තැන යාත්‍රාහොරු අනවකාසකොට තබා හොරුපිට ඇවරිබඳවා තැන තැන මණ්ඩපකරවා සුවිසිදහසක් මහසඞ්ඝයා මුහුදුපිට වඩා හිඳුවා පෙරවරු මහදන්දී පස්වරු තුලාභාරදන්දී තුන්යම් රාත්‍රියෙහි ලඞ්කාද්වීපය සිසාරා එකපාන් ඇගෑයක්සේ හෙලඟි තෙලින් පාන් පූජා කෙළේය. මෙසේ ඒ රජද කුසල් කොට දෙළොස් අවුරුද්දක් දැහැමෙන් රජකොට දෙව්ලොව ගියේය.

37. ඔහුපිත් අඬගැමුණු රජ මුළුහෙළදිව සතුන් නොමරණ පරිද්දෙන් බෙරලවා සියළු සතුන් පවිකළ නොදී පින් කොට නවඅවුරුදු අටමසක් රජකොට දෙව්ලොව ගියේය.

38. ඔහුමල් කිණිහිරිදළ මහරජ බෑ රජහු මරා තෙමේ තුන් අවුරුද්දක් අධම්මයෙන් රජකොට අපා ගනවිය.

39. පෙරකී අඬගැමුණු මහරජහුපිත් චූලාභය මහරජ අවුරුද් දක් රජකෙළේය.

40. ඔහුනග සිංහවල්ලිනම් බිසොව සාරමසක් රජකළාය.

41. අඬගැමුණුරජ බෑනා එළුන්නාරජ ඈ තමහට බිසෝකොට සහවුරුද්දක් රජකෙළේය.

42. ඔහුපිත් සඳමුහුණුරජ අටඅවුරුදු සත්මසක් රජකෙළේය.

43. ඔහුමල් යසසිළුනම්රජ සත්අවුරුදු අටමසක් රජකෙළේය.

44. ඔහුමරා සුභනම් බලතෙක් සහවුරුද්දක් රජකෙළේය.

45. ඔහුමරා වහප්මහරජ අනුරාධපුරනුවර එකි එකී අතින් සතර සතර ගවුවෙකි සොළොස්ගවු සිසාරා මහපවුරක් ලවා

මහවැව් සොළසක් බඳවා ථූපාරාමයෙහි වටදාගෙය කරවා නොයෙක් කුසල්කොට සූසාළිස් අවුරුද්දක් රජකොට දෙව්ලොව ගියේය෴

46. ඔහුපිත් වක්නැහිස්නම්රජ තුන්අවුරුද්දක් රජකෙළේය෴

47. ඔහුපිත් ගජබාහුනම්රජ තමාදවස ලක්දිවින් කාවේරියෝ මෙහෙයට යෙති යනු අසා අමාත්‍යයන් ගෙන්නා විචාරා උදහස්ව පියරජහු කරවූ යොධයන් පණසක් ඔසවාදිලන තමන්ගේ යගදාව ගෙණ දක්‍ෂිණ කොට සයුරු පැහැර පින්බෙලෙන් දිය දෙබෑකොට පිටිපතුල් නොතෙමා සොළීරට ගොස් තමාගේ බල පෑ කාවේරියේ මෙහෙයට ගියවුන් හරවා එනනසිට කාවේරියේ මෙහෙයට ලක්දිව් වැස්සන් නොගන්ට ව්‍යවස්ථා කරවා මුහුදු කරය වටා රැකවල් ලවා අවුත් ලක්දිව බෙර ලවා බොහෝ කුසල් කොට දෙවිසි අවුරුද්දක් රජකොට දෙව්ලොව ගියේය෴

48. ඔහු සුහුරුබඩු මහළු මානාරජ සාවුරුද්දක් රජකෙළේය෴

49. ඔහුපිත් භාතිය තිස්සරජ නාගදිවයින කිරිපළුගස මුල පළු දාගෙය කරවා සූවිසි අවුරුද්දක් රජකෙළේය෴

50. ඔහුමල් චූලතිස්සරජ අටළොස් අවුරුද්දක් රජ කෙළේය෴

51. ඔහුපිත් කුහුන්‍යාරජ දෑහැවුරුද්දක් රජ කෙළේය෴

52. ඔහුමරා කුඩානාරජ අවුරුද්දක් රජ කෙළේය෴

53. ඔහු බෑනා කුඩාසිරිනාගරජ එකුන්විසි අවුරුද්දක් රජ කෙළේය෴

54. ඔහුපිත් වොහාර තිස්ස නම්රජ දෙවිසි අවුරුද්දක් රජ කෙළේය෴

55. ඔහුමල් අබාසෙන්නම් රජ අටඅවුරුද්දක් රජ කෙළේය෴

56. පෙරකී වොහාරතිස්ස රජහු පිත් සිරිනාගනම් රජ දෑහැවුරුද්දක් රජකෙළේය෴

57. ඔහුපිත් විජයිඳු රජ අවුරුද්දක් රජ කෙළේය෴

58. ලමැනිකඩින් ආ සඞ්ඝතිස්සනම් රජ සතර අවුරුද්දක් රජ කෙළේය෴

59. ඔහු ඉක්බිති දැහැමි සිරිසඟබෝරජ අනවැකි දියෙන් කර වටා ඇඳ බුදුබැව් පතා දිළිඳක්හට ඉසදන්දී දෙවියන්ගේ බලයෙන් කැසූහිසින් දෙස් කියවා ඒ දිළිඳුහට බොහෝ සැපත් දෙවා දෑවුරුද්දක් දැහැමින් රජකොට දෙව්ලොව ගියේය෴

60. ඒ ගොළුඅබා රජ ඔහුකෙරේ පැහැද ඉස දන්දුන් තෙනට අවුත් එතන වටදාගෙයක් කරවා අනුරාධපුර නුවර ගොස්

ලෝවාමහාපාය පස්මහලක් කරවා තෙලෙස් අවුරුද්දක් රජ කොට දෙව්ලොව ගියේය

61. ඔහුපිත් කලකන්දෙව්තිස්රජ ඔහු සාඳගතනුහුණු ලේලෑ මැන්නන් සැටදෙනෙකු අල්වා මරා උල්හිඳුවා රජය ගෙණ ඒකාතපත්‍රකොට පියානන් කරවා නොනිමි ලෝවාමහාපායේ තුබූ සතර මහල නිමවා කොත් පලඳවා මහපූජාකොට මහවැව් සතරක්හා මුල්ගිරිවෙහෙරආදී මහවිහාර සතරක් කරවා මහ පූජා කොට දසඅව්රුද්දක් දැහැමෙන් රජකොට දෙව්ලොව ගියේය

62. ඔහුමල් මහසෙන්රජ රජව යකුන් අතින්ද මෙහෙ ගෙණ මිණිහිරිවැව බඳවා විසිදහසක් කුඹුරු කිරි කරවා දෙනානකයෙහි සංඝයාවහන්සේට දන්වරුපෙත් කොට ලවා මිනිහිරි වැව් ඇතුළුව මහවැව් සතළොසක් යක්‍ෂයන්හා මනුෂ්‍යයන් අතින් මෙහෙ ගෙණ බඳවා දෙනානකනම් මහාසෑය බැඳ දෙව්යන් දුන් පටිධාතුව පිහිටුවා මහත්වූ පූජාකොට විසිහත්අවුරුද්දක් රජකෙළේය

විජයරජහු පටන් මේ මහසෙන්රජු අවසන්කොට මහවංශයෙහි ඔවුනුපලන් රජදරුවෝ දෙසැට දෙනෙක් වූහයි දතයුතුය

මෙවකට අපබුදුන් පිරිනිවි අටසිය සූසාළිස් අව්රුදු නව මස් පස්විසි දවසක් ගියේයයි දතයුතු

මේ මහසෙන්රජ දඹදිව කලිඟුරට ගුහසීවරජුහා අදෘෂ්ට මිත්‍රව වසනුයේ දළදාවහන්සේ ගෙණඑනු පිණිස බොහෝ මුතු මැණික් ආදිය ගුහසීව රජහට පඬුරුපිණිස දෙනසේ අමාත්‍යයන්ට බාරදී පිටත් කෙළේය, ඒ ගුහසීවරජ තමා බෑනාවූ දන්ත කුමාරයාටහා තමන් දූ රන්මාලිනම් කුමාරියහා මෙම දෙමහල්ලන්ට දළදාවහන්සේ ලඞකාවීපයට ගෙණඑනු පිණිස භාර කොට දුන්කල්හි වෙස්වලා බමුණුවෙස් ගෙණ දළදා වඩාගෙණ වුත් ශ්‍රීලඞකාවට ගෙණඑන කල්හි එම මහසෙන් රජ
63. ජන්මාන්තරගතව කිත්තිස්ශ්‍රී මෙඝනම් රජෙක් රජවිය
එරජ දළදාවහන්සේ දැක බුදුන්ගේ දළදා සුභ්‍රවණීයයි ඇසිමි, සැක සිතා සියයක්පමණ වස්ත්‍රපටලයෙන් වසාසිටිකල්හි එකෙණෙහි ශ්‍රීදන්තධාතුන්වහන්සේ ඒ වස්ත්‍රපටල ප්‍රදාළනය කොට අහසට පැනනැගී සියළුදිගුන් ඔෂධී තාරකාවක් මෙන් බබුළුවමින් ඒ රජුහාසියළු ජනයන්ගේ සැකදුරුකරමින් ප්‍රාතිහාර්‍ය්‍ය දැක්වූ කල්හී ඒ ප්‍රාතිහාර්‍ය්‍යයෙහි පැහැද මුළුලක්දිව දළදාවහන්සේට පුද අනිකුදු අප්‍රමානවූ මහත් පූජාකොට අටවිසි අවුරුද්දක් රජ කෙළේය

64. ඔහුමල්දෙටතිස්රජ දලකඩ සඳුන්දඬු ආදියෙන් සියඅතින් පිළිම නෙලා මතු ලොවට ඇදුරුකොට තබා නටබුන් වෙහෙර හැම කරවා මහත්වූ පූජාකොට ලෝවැඩ සසුන් වැඩකොට නව අව්රුද්දක් රජකෙළේය.

65. ඔහුපිත් බුද්ධදාසරජ ලක්දිව ගම්දසයකට වෙදෙකු නැකැත්තෙකු බණකියන පණ්ඩිතකෙනෙකුන් බැගින් ඇති කරවා අනුරාධපුරනුවර පස්විසිරියන් පමණ පස්මහල් නිල්වූ බිම්භිකති පලසෙවෙනි ආදීන් මයුරාකාර වර්ණඇති මොනර පා පිරිවෙණ ආදි බොහෝ විහාර කරවා සඟ පන්සියයකට නිති දන්තබාදී බොහෝ ලෝවැඩ සසුන් වැඩකෙරෙමින් බුදුබැව් පතා එකුන්තිස් අවුරුද්දක් දැහැමෙන් රජකෙළේය.

66. ඔහුපිත් උපතිස්සනම්රජ අභවනගළු වෙහෙර වසන මහා සළුවිරකෙනෙකුන්වහන්සේ රහත්වන දවස මහපොළව කම්පා අසා එතැන්හී ගොස් පස්මාල් ප්‍රාසාදයක් කරවා අනේකප්‍රකාර විචිත්‍ර කර්ම්මාන්තයෙන් අලංකෘතකොට රන්කම් කරණලද තාම්බ්‍රපත්‍රමය උළින් සොයවා දිව්‍යවිමානයක්මෙන් සරහා එම ක්ෂීණාශ්‍රවයන්වහන්සේ ප්‍රධානකොට ඇති මහසඟනට පිළිගන්වා පරිජන සහිතවූ ග්‍රාමක්ෂෙත්‍රයන් ඒ ප්‍රාසාද සන්තක කොටදී අනිකුදු පලාවන් පිරිවෙණ ආදිවූ බොහෝ විහාර හා තෝපාවැව ආදිවූ බොහෝ වැව්බඳවා ලෝවැඩසසුන් වැඩකොට දෙසාළිස් අවුරුද්දක් රජකෙළේය.

67. ඔහුමල් මහානාමනම්රජ දෙවිසිඅවුරුද්දක් රජකෙළේය.

68. එකල බුද්ධඝොසනම් අටුවා කතෘන්වහන්සේ දඹදිවින් මෙලක වැඩ බුදුන් වදාළ පාලිධර්ම්මයට අටුවාකථා ලියා ආගම යෙහි පහන්නැගුසේක. මේ මහානාමරජු නොසමානදරු සෙන් ගොත්නම්රජ පෙරවරු රජව සඟාරද දූන් විසින් විසයොදන ලදුව පස්වරු මෙළේය.

69. සඟාරද දූන් බිසෝකොට ලැමැනිතිස්රජ අවුරුද්දක් රජ කෙළේය.

70. ඔහු ඉක්බිති මිත්සෙන්නම් කරල් සොරෙක් රජය ලදින් දවසෙක දළදා වඩින්නට ගොස් නැවත රජගෙට එනුයේ දළදා ගෙයි දොරසිට මගුලැතුගෙනැයිකීය ඇමතියෝමගුලැත් පසුවිය මදක් බලව මහරජැයි කීහ. එබසට රජකිපී උළින්සුන්නෙන් බැඳනැගු මහා ඇත්රුවක් බලා තෝමට පිට නොදේදැයි කීය. එකෙණෙහි ඒඇත් රජුකරා අවුදින් පිටහිඳුවා නුවර පැදකුණු කොට රජු රජගෙයි ලාගිය. මෙසේවූ ආඥවක් ගියජාතියෙහි සිත නොපහදවා පිදූ එක මලෙකින් ලදහයි දතයුතු.

71. මෙසේ ඒ කරල්සොර රජ අවුරුද්දක් රජකෙළේය.

72. එකල සොළීරජයෙන් දෙමළ සදෙනෙක් බලසෙන් ගෙණ ලක්දිව් බැස ඒ කරල්සොර රජහු මරා පිළිවෙළින් වෙන වෙනම සත්විසි අවුරුද්දක් රජකෙළේය.

73. එකල ධාතුසේනරජකුමර සසුන් වැද මහණව වෙස්වලා වැඩි සිවුරුහැර මායාරට බලසෙන්ගෙණ නුවර ගොස් පසුව රජකරණ දෙමළා මරා රජව කලා බලළුආදි මහවැව් අට ලොසක් බදවා අටලොස්මහ විහාරයන් කරවා අටලොස් හවුරුද්දක් රජකෙළේය.

74. ඔහු නොසමාන දරු සීගිරි කසුබුරජ පියරජහු මරා සීගිරිගල කරවා එහිවැස අටලොස් අවුරුද්දක් අධම්මයෙන් රාජ්ජය කොට කපක් කල් දුක්ගන්නා අවීචිමහා නරක යෙහි ගිය.

75. එම දසෙන් කැලිරජහුගේ සමානදරුවූ මුගලන්රජ සීගිරි රජහුගෙ හයින් දඹදිව් ගොස් බලපිරිස් ගෙණ ලක්දිව්බැස පිය රජහු මැරූ සීගිරිකසුබු රජු මරා අටලොස් අවුරුද්දක් රජ කෙළේය.

76. ඔහුපිත් කුමාරදසරජ මහාපඬිව නවඅවුරුද්දක් රාජ්ජය කොට කාලිදසනම් යහළුවා මළදා තෙමේද ගිනිවැද පරලොව ගියේය.

77. ඔහුපිත් කිත්තිසෙන්නම්රජ නවමසක් රජ කෙළේය.

78. ඔහුමයිල් මැදිසිව්රජ බැනා මරා පස්විසිදවසක් රජ කෙළේය.

79. ඔහු මරා ලැමැණිඋපතිස්සරජ එක්අවුරුදු සමසක් රජ කෙළේය.

80. ඔහුමරා ලමැනි අඹහෙරණ සලමෙවන්නම්රජ තෙළෙස් අවුරුද්දක්රජ කෙළේය.

81. ඒ රජුකාලයෙහි දුර්ලබ්ධිගත් දුස්සිල මහණුන් දුරුකොට ඔවුන්ගේ පොත්පතුදු දවා හළකොට සාසනොපකාරි වූයේය.

82. මෙසේ ලක්දිවට පැමිණි රජුන් විසින් තුන්වරෙක වෛතුල්‍යවාදයන් ලියවූ පොත් පත් දවා හළකොට සාසනයට බලය දී පැවැත්වූවාහුය.

83. ඔහුපිත් දපුළුසෙන්රජ සමසක් රජකෙළේය.

84. ඔහු මරා මොහුබැනා දලමුගලන්නම් රජ විසිඅවුරුද්දක් රජ කෙළේය.

85. ඔහුපිත් කුඩාකිත්සිරිමෙවන් රජ එකුන්විසි අවුරුද්දක් රජ කෙළේය෴

86. ඔහු මරා ඔකාවසින් ආ සෙනෙවිමහරජ තුන් අවුරුද්දක් රජ කෙළේය෴

87. ඔහු මරා ලැමැනිසිඟාන් සලදලනාබෝ රජ නව අවුරුද්දක් රජ කෙළේය෴

88. ඔහු මරා මානාරජහු බෑනන් අක්බෝ රජ කුරුඳුවැව ආදිවූ බොහෝ වැව් බඳවා මානාරජ පිරිවෙණ කරවා සුතිස් අවුරුද්දක් රජ කෙළේය෴

89. මොහුබෑනා කුඩාඅක්බෝ රජ ගඟතලා ආදිවූ වැව්තුදුසක් බඳවා ගඟවිට වෙළුන්නාවෙහෙර කරවා මහත්වූ පූජාකොට දසඅවුරුද්දක් රජ කෙළේය෴

90. ඔහුමල් සඟතිස් රජ දෙමසක් රජ කෙළේය෴

91. ඔහු මරා ලැමැනිබෝනාමුගලන් රජ සඟවුරුද්දක් රජ කෙළේය෴

92. ඔහු මරා අසිගගාහක රජ නවඅවුරුද්දක් රජ කෙළේය෴

93. ඔහු පිත් සිරිසඟබෝ රජ සොළොස් අවුරුද්දක් රජ කෙළේය෴

94. ඔහු පරදෙශයට පන්වා ලැමැනි කටුර දෙටතිස් රජ පස් මසක් රජ කෙළේය෴

95. නැවත සිරිසඟබෝරජ පරදෙසින් බල පෙරලාගෙණ අවුත් දෙටුතිසු මරා රජය ගත෴

96. ඔහු මරා ලමැනිදලපතිස් රජ පැලැවතු වෙහෙර කරවා දෙළොස් අවුරුද්දක් රජ කෙළේය෴

97. ඔහු මරා සිරිසඟබෝ රජහු මල් පැසුළු කසුබු රජ නව අවුරුද්දක් රජ කෙළේය෴

98. නැවත ඔක්කාක වංසයෙන් ආ දපුළුනම් රජ එකුන්විස් සක් මහා විහාර කරවා තුන්අවුරුදු තුන්මසක් රජකෙළේය෴

99. නැවත ලැමැනිදලපතිස්නම් රජ කපාරා පිරිවෙණ කරවා නවඅවුරුද්දක් රජ කෙළේය෴

100. ඔහු බෑ සිරිසඟබෝ රජ පියගුල් පිරිවෙණ කරවා දෙව් නුවරද කරවා දෙව්රජුන්ගේ සහායෙන් සොළොස් අවුරුද්දක් රජ කෙළේය෴

101. ඔහු ඉක්බිති ඔක්කාකවංසයෙන් ආ වල්පිටි වසිදත්මහරජ දෑහැවුරුදු සමසක් රජ කෙළේය෴

102. ඔහු ඉක්බිති හුනන්නරුරියන්දළා සමසක් රජ කෙළේය෴

103. පෙරකී සුළුකසුබුරජ පිත් මහලැපානෝ පරදෙසින් බල පිරිස් ගෙණවුත් හුනන්නරුරියන්දළු මරා රජයගෙණ පන්තිස් අවුරුද්දක් රජය කෙළේය෴

104. ඔහුපිත් අක්බෝ රජ සහවුරුද්දක් රජ කෙළේය෴

105. ඔහුමල් කසුබුමහරජ හෙලගම්පිරිවෙණ කරවා සත්අවුරුද්දක් රජ කෙළේය෴

106. ඔහුමල් මිදෙල් රජ තුන්අවුරුද්දක් රජ කෙළේය෴

107. ඔහු බෑ දරු අක්බෝ රජ හතළිස් අවුරුද්දක් රජ කෙළේය෴

108. මිදෙලපානන්දරු කුඩාඅක්බෝ රජ සහවුරුද්දක් රජ කෙළේය෴

109. අක්බෝරජු දරු සලමෙවන් රජ බලාත්කාරයෙන් රජය ගෙණ විසි අවුරුද්දක් රජ කෙළේය෴

110. ඔහු ඉක්බිති උදු මහරජ පස්අවුරුද්දක් රජ කෙළේය෴

111. ඔහු ඉක්බිති හැලිගැරවිල්හිස සැසො මිහිඳු රජ සතර අවුරුද්දක් රජ කෙළේය෴

112. ඔහු ඉක්බිති අක්බෝ රජ එකොළොස් අවුරුද්දක් රජ කෙළේය෴

113 ඔහුමල් දපුළු මහරජ මහබෝගෙය කරවා රන් බුදුරු කරවා මහ පූජා කොට සොළොස් අවුරුද්දක් රජ කෙළේය෴

114. ඔහුදරු අග්බෝ මහරජ තුන් අවුරුද්දක් රජකෙළේය෴

115. ඔහුමල් සෙන් මහරජ දෙනාවෙහෙර ආදී බොහෝ පිරිවෙන් කරවා මහත්වූ පූජා කොට විසි අවුරුද්දක් රජ කෙළේය෴

116. මොවුන් දවස අනුරාධපුරනුවර පැහැර ජයබෙර මිණිපා ගෙණ ගියහ෴

117. මොහුමල් මුගයින්වැසි සෙන්මහරජ ශ්‍රී ලඞකාවිපයෙහි සිංහල බලසෙන් ගෙණ දඹදිව ගොස් පාඬිරජය පැහැර පාඬින් එහු බඳවා ජයබෙරමිණිපා ගෙණවුත් ලෝවාමහපාය කටු කොහොල්හරවා එහි රන්බුදුරු කරවා තුන්නකය දහම් ගන්වා ලෝසසුන් සෙමෙහි තබා තෙතිස් අවුරුද්දක් රජ කෙළේය෴

118. ඔහුමල් උදුමහරජ රුහුණුරට තුඹරුක්වෙහෙර කරවා රන් රිදී පතින් වසා නොයෙක් පූජා කොට එකොළොස් අවුරුද්දක් රජ කෙළේය෴

119. කසුප් මහරජ තුන්නකගෙයි සල පිළිමයට රන් සේසත්කරවා බගිරිනක මහාසැය බඳවා කුඩාකපාරා මහකපාරා පිරිවෙන් කරවා මහත්වූ පූජා කොට සතළොස් අවුරුද්දක් රජ කෙළේය෴

120. ඔහු ඉක්බිති කසුබු රජ දසඅවුරුද්දක් රජ කෙළේය.

121. පසුව දපුළුනම් කුමර සත්මසක් රජ කෙළේය.

122. ඔහුමල් කුඩා දපුළුනම් කුමර සොළීරටින් ආ දෙමළුන් මරා එහුබඳවා දෙළොස් අවුරුද්දක් රජ කෙළේය.

123. මොවුන් අයාමෙන් උදමහරජ තුන්අවුරුද්දක් රජ කෙළේය.

124. ඔහුමල් සෙන් නම් මහරජ නව අවුරුද්දක් රජ කෙළේය.

125. ඔහු ඉක්බිති උදමහරජ අටඅවුරුද්දක් රජ කෙළේය.

126. ඔහුපිත් සෙන්නම්රජ තුන්අවුරුද්දක් රජ කෙළේය.

127. ඔහු ඇවෑමෙන් කුඩාමිහිඳෙල් රජ සොළීරටින් හූරාතොට බට දෙමළරජෙකුහා මහසෙනඟක් සාද සොළොස් අවුරුද්දක් රජ කෙළේය.

128. ඔහු අවෑමෙන් සළමෙවන් රජ මහදෙමළුන් මරවා රජය ගෙණ සිව්වසක් රජ කෙළේය.

129. ඉන්පසු ඔහු බෑ සෙන් සෙනෙවි රදුන් දඹදිව් ගොස් පසානුදහසක් පමණ දෙමළ බලපිරිස් ගෙණ ලක්දිව් බට කල ඔවුන්හා යුද කොට කොටම දසඅවුරුද්දක් රජ කෙළේය.

130. ඔහුමල් මිහිඳුරජ අටසාළිස්අවුරුද්දක් රජ කෙළේය.

131. ඔහුපිත් වික්‍රමබාහුරජ පියරජසමයෙහි ලක්දිවට බැස පුරාහුන් දෙමළ බලපිරිස් මරා දියපිට නන්වා රුහුණෙ දෙළොස් අවුරුද්දක් රජකෙළේය.

132. පසුව මහලේ රජ තුන්අවුරුද්දක් රජ කෙළේය.

133. පසුව වික්‍රමපාණ්ඩිරජ තුන්අවුරුද්දක් රජකෙළේය.

134. ඔහු ඉක්බිති ජගත් පාලනම් රජ සතර අවුරුද්දක් රජ කෙළේය.

135. ඔහු ඇවෑමෙන් පරාක්‍රම පාණ්ඩි රජ දෑහැවුරුද්දක් රජ කෙළේය.

136. එකල සොළිරටින් පසානුදහසක් දෙමළු නැවත ලක්දිව් බැස ලොකශාසන නැසූහ; එකල ලෝකෙශ නම් සෙනෙවි ලක්දිව රජුන් නැත්තෙන් රුහුණෙ හිඳ සහවුරුද්දක් රජ කෙළේය.

137. පෙරකී සළමෙවන් රජහට දෙවන දුරුතුපුර සැටවක පටන් ඒ ලෝකේශ නම් සෙනෙවියන්ගේ සහාවුරුද්ද ඇතුළත සයාසූ අවුරුද්දක් පමණ සොළින් වසඟව දෙමළුන් හිම්වතුබූ ලංකාවීපයෙහි මහළුවිජයබාහුනම් රජ පැනනැඟී

ලක්දිව හුන් දෙමළුන් මරා එහුබැද තුන්රජය ඒකාතපත්‍ර කොට මළුකම් කරවමියි මුළුලක්දිව ගණපූරණයට පස්නමක් පමණ සිල්වත් උපසපන් භික්ෂූන් නැතිහෙයින් දෙමළුන් විසින් නට ශාසනයෙහි උපන් මහත්වූ කරුණාඇතිව වැලප ලක්ෂ ගණන් මුතුමැණික් ආදී පඬුරු අරමණයට යවා අරමණයෙන් සිල්වත් සථවිරයන් විසිදෙනෙකු ගෙන්වා ආගමයද ගෙන්වා මළුකම් කරවා දහස්ගණන් භික්ෂූන් ඇති කරවා ලක්දිව් මුළුල්ලෙහි නටබුන් වෙහෙර දාගැප් සසුන් කරවා අප්‍රමාණවූ සසුන්වැඩ ලෝවැඩ කොට රාජනීති ලෝකනීති නොවරදවා සූපණස්අවුරුද්දක් රජ කෙළේය.

138. ඔහුමල් ජයබානම් රජ තුදුස්අවුරුද්දක් රජකෙළේය.

139. ඔහු ඇවෑමෙන් මහළු විජයබාහු පිත් වික්‍රමබාහු රජ අටවිසි අවුරුද්දක් රජ කෙළේය.

140 පසුව කිත්සිරිමෙවන්රජහු පිත් පරාක්‍රමබාහුනම් මහළු මහරජ ඔටුනුපැලද රජපැමිණ උදාරතර කුසලානුභාවයෙන් යුක්තව තුන්සියසිව්සැට වන්නිපත්තු සාදා දිපච්චක්‍රවතීනිව ලක්දිව නොයෙක්වර දෙමළු අවුත් ලෝකශාසනය නසති අසා මිථ්‍යාදෘෂ්ටිගත් රජුන්ට උදහස්ව දඹදිව සාදා සම්‍යක්දෘෂ්ටි ගන්වමින් ලක්දිව් මුළුල්ලෙහි සූවිසිලක්ෂ පස්විසිදහසක් පමණ රන්සිරිඔත් අගම්පඩින්හා එසේම ජයවිරිදුලා සිටිනා නවලක්ෂ පසානුදහසක් පමණ ඇමතිමහාසෙනග ගෙණ දඹදිව් යන්ට නික්මිණ, ඒඇසූ මහසඟ රජහුගේ ගමන් වැලැක්වූ හෙයින් තුමූ. නොගොස් සියයෙන් දසදෙනාබැගින් නිස්සන් තෝරා එක් විසිලක්ෂ පස්විසිදහසක් පමණ සිංහල මහ යෝධයන් දෙශාන්තර යවා සොලී පාණ්ඩිරජ්‍යෙහි පටන් අරමනය දක්වා යුද කරවා ගියගිය තන්හී ජයගන්වා පරදෙශ වාසීන් සිංහලයට බස්නාතබා තමතමන්ගේ දෙශයෙනිදු භයගෙණ හිඳිනාසේ දඹදිවට අනසක් පතුරුවා අවුරුදු පතා මළුකම් පූජාවක්ද දළදාපූජාවක් තුලාභාරයක් වෙසක් කෙළියක් යනාදී සූසැටක් මගුල්දම්කොට දවස්පතා පෙන්තක් පිළිමයක් සළුඅටපිරිකරක් බැගින් නොවරදවා දී අප්‍රමාණ පූජාකිරීමෙන් තෙතිස්අවුරුද්දක් රාජ්‍යය කරමින් නිම්මලවූ සම්බුද්ධශාසනය දුස්ප්‍රතිපත්තින් කෙළෙසන ධම්රුචිය සාගලිකය වෛතුල්‍ය වාදිය යන නිකායවාසිවූ නොයෙක් සියගණන් මිථ්‍යාදෘෂ්ටි මහණුන්ගෙන් ශාසනය කිළුටුව පිරිහෙන පවත් අසා සුපරිසුද්ධවූ බුද්ධශාසණයෙහි කිළුටක් අසඅසා මාවැනි ආඥාචක්‍රවතීනියක්හු උදාසීන උවහොත් බුදුසස්න නසී, බොහෝ සත්වයෝ අපායභාගි වෙති පස්වාදහසක් පවත්නා බුද්ධ ශාස

නයට මා පිට්වහල් වූවමැනවැයි ප්‍රඥාපූරස්සර කරුණාවෙන් ඒ දෘෂ්ටිගත් දුස්සීලමහණුන් ගෙන්වා ලතාමණ්ඩපයෙහි රැස් කරවා තුන්යම්රාත්‍රියෙහි සිට්පියෙහිම සිට විචාරා නියමකොට ඔවුන් හැමදෙනා ශාසණයෙන් පිටකරවා ශාසණය ශුද්ධකොට එම කුශලානුභාවයෙන් අවසන්හි සවාසුදහසක් රන්රිදීකුළින් ප්‍රතිමණ්ඩිතවූ හිමාලවනප්‍රදෙශයෙහි රන්ගිරිපර්වතයක කල්පස්ථායුවූ නරදෙවනම් දිව්‍යරාජත්ව උපන්හ.

141. පසුව ඔහුබෑනා පණ්ඩිතවිජයබාහු රජ අවුරුද්දක් රජ කෙළේය.

142. කෙලින්කෙස්ද මිහිඳාදි පනාපනම් එඩෙහෙරදුව නිසා ඔහුමරා තෙමේ පස්දවසක් රජ කෙළේය.

143. ඔහු මරා කාලිංගයෙන් ආ කීර්තිනිස්සඞ්කනම් රජ පොලොන්නොරුවෙහි රුවන්වැලිදාගැබ බඳවා කොත්පළඳවා දළදාමළුවෙහි ශෛලමය දළදාගෙය සැටපැයකින් කරවා බලසෙන් සමගින් සමනල ගොස් බුදුන්ගේ ශ්‍රී පාදය වැඳ ලක්දිවවටා තමන්නමින් අරම් අම්බලම් ගොනවූ කරවා දඹුළුවෙහෙර රන්පත්ගස්වා තෙසැත්තෑවක් මහපිළිම රන්ගාවා නිමවා රන්ගිරිදඹුල්ලයයි නම් තබා බොහෝ පින්රැස්කොට නවඅවුරුද්දක් රජ කෙළේය.

144. ඔහුපිත් වීරබාහුරජ රෑ රජව අළුයම නාවුරුසෙනෙවි රජහුවිසින් ඔහු නොසමාන දරුයයි මරණලදවිය.

145. පසුව වික්‍රමබාහුරජ තුන්මසක් රජ කෙළේය.

146 ඔහු මරා නිස්සංක රජහු බෑණා චොඩගංග රජ නවමසක් රජ කෙළේය.

147. පසුව කිත්සෙනෙවිරත් ඒරජහු ඇස්උදුරුවා පහකොට මහළු පරාක්‍රමබාහු රජහු අගබිසෝ ලීලාවතීනම් බිසවුන් ලවා තුන්අවුරුද්දක් රජ කැරවිය.

148. පසුව ඔක්කාක වංශයෙන් ආ සාහසමල්ලරජ දෑවුරුද්දක් රජ කෙළේය.

149. පසුව එලලු අබෝසෙනෙවිරත් ඒ රජහු පහකොට නිස්සංක රජහු අගබිසෝ කල්‍යාණවතීනම් බිසවුන් ලවා සහවුරුද්දක් රජ [කැ]රවිය.

150. පසුව ධර්මාශොකනම් තුම්මැසි රජකුමරුවෙක් අවුරුද්[දක්] රජ කෙළේය.

151. පසුව ඇනියඟනම් රජ දඹදිවින් බලපෙරළා අවුත් ලක්[දිව]බැස පොලොන්නොරු ගෙණ තමාපුතු ධර්මාශොකනම්

රජකුමරුහා එළලුඅබෝ සෙනෙවිරදුන්මරා තෙමේ සතළොස් දවසක් රජ කෙළේය෴

152. පසුව මොහුගේ මනක්කානම් සෙනෙවිරත් ඔහු මරා පෙර රජකල ලීලාවතීනම් බිසවුන් ලවා අවුරුද්දක් රජ කැරවිය෴

153. පසුව ලොකෙසවරනම් රජ පරදෙසින් දෙමළ පිරිස් ගෙණවුත් කඳවුරුනුවර ගෙණ පස්මසක් රජ කෙළේය෴

154. පසුව ලීලාවතීනම් බිසව සත්මසක් රජ කළාය෴

155. ඔවුන් පහකොට පාණ්ඩිරටින් බලසෙනගගෙණ පරාක්‍රම පාණ්ඩිරජ තුන්අවුරුද්දක් රජ කෙළේය෴

156. පසුව ලඞ්කාවාසීන්ගේ කිසියම් දරුණු අකුසල කර්‍මයක් හේතුකොටගෙණ ලක්දිව ආරක්‍ෂාවෙහි නියුක්ත මහෙශාක්‍ය දෙවියන්ගේ කිසියම් උපෙක්‍ෂාවක් විද්‍යමානවූකල්හී බෞද්ධයන්ගේ උත්සන්නභාවයක් පහළවූ කල්හී මාඝරාජනම් කලිඟුරජ සූවිසිදහසක් මලලසෙනග ගෙණ ලක්දිව් බැස කඳවුරුනුවර ගෙණ පාණ්ඩිරජහු ඇස් උදුරුවා ලෝකශාසන නසා රුවන්වැලිසැය බිඳුවා සෙසුත් දහස්ගණන් දාගැබ් බිඳ නොයෙක් ශ්‍රද්ධාවන්තරජුන්ගේ චෛත්‍යනැමති කීර්තිශරිරවල කොත්නමැති ඔටුනුහා රුවන්නමැති හෘදමාංස ගෙණ ධාතුනමැති ජීවිත අන්තර්ධාන කරවා සංඝාරාම අයතැන් මහපා දෙමළුන්ට ගෙවල්කරවා ලක්දිව කුලස්ත්‍රීන්ගේ ජාතිසම්භෙද කොට කුලදරුවන් සිවැසිකරවා සිරිලක මිථ්‍යාදෘෂ්ටිගන්වා සුඛිතයන් ධනවිචාරයෙන් හස්තපාදාදී ඡෙද්‍යයෙන් විකාරයට පමුණුවා ලඞ්කාවීපය ගිණිගත් ගෙයක්සේ කරවා ගම ගම දෙමළුන් ලවා බලාත්කාරයෙන් එකුන්විසි අවුරුද්දක් රජ කරවිය෴

157. මෙසේ ලක්දිව නටකල්හී යටකී මහබෝ වඩා ආ සිරිසඟබෝ වංශයෙන් නොනැසී ආ කාලිඞ්ග විජයබාහුනම් රජ මායාරජයේ හිඳ වැඩි අන්ධකාරයෙහි තේජෝකඳක් සේ පැන නැගී සිංහල බලපිරිස් ගෙණ ගම ගම හුන් දෙමළුන් මරා එහුබදවා පිහිටිරජය පැහැර මායාරජය තැන්පත් කොට එහි ජම්බුද්‍රෝණී නම් පුරයක් කරවා එහි හිඳ රජකරණුයේ යටකී දෙළොස්රජුන් කාලයෙහි දෙමළවිසවුලෙන් දළදාපාත්‍රාධාතුන්වහන්සේ ගෙණ මහගල්වල් නැගී වනදුගී ගිරිදුගී ජලදුගීයෙන් දුගීවූ කොත්මල ගොස් එහින් රුකලිය නොහී භූමිගතව නිධාන්කොට සොළීපාණ්ඩිරජයට ගිය මහසළුවිරගණයා මායාරජයට ගෙන්වා දළදාපාත්‍රාධාතූන් නොනට පවත් අසා අනිසනොත්ෂව එකොණෙහි මහසඟගණහා මහසෙනග ගෙණ

මහත්වූ පූජෝත්සවයෙන් කොත්මල ගොස් දළදාපාත්‍රාධාතූන් වහන්සේ ගෙණ සක්විතිරජය ලද්දක්මෙන් උදාරවූ සන්තෝෂයෙන් ගම ගම මහත්වූ පූජා කරවමින් වඩා ගෙණවුත් මතු අරාජිකයෙක නොනස්නාසේ දළදාපාත්‍රාධාතූන් වහන්සේට හේමස්ථානයක් කරවමියි සිතා බෙලිගල සිසාරා පවුරුපදනම් වහසලින් සුරක්‍ෂිතකොට ආකාශයෙන්මුත් මනුෂ්‍යකෙනෙකුන් වැද්දනොහැකිසේ ඉතා සුරක්‍ෂිත කොට පර්වත මුදුනෙහි දෙව් ලොවින්බට දිව්‍ය විමානයක්සේ දළදාගෙය කරවා සිසාරා රන්පත් ගසා සුළුපා මහපා චංක්‍රමන පැන්පොකුණු ආදියෙන් යුක්තවූ සඞ්ඝාරාම කරවා මහත්වූ මඞ්ගල්‍යයෙන් දළදාපාත්‍රාධාතූන් ගෙට වඩා දන්තධාතු ආරක්‍ෂාවෙහි නියුක්තවූ ස්ථවිරවරයන්ට සඞ්ඝාරාමය පිළිගන්වා දානවෘත්ති තබා දී දවස් පතා පූජාපෙළහර කරණසේ නියමකොට නැවත තමන්නමින් විජයසුන්දරාරාමනම් මහවිහාරයක් කරවා, තවද වත්තල තමන්නාමින් විජයබාහුනම් රජ මහවිහාරයක් කරවා දෙමළුන් නැසූ කැලණිවෙහෙර නැවත බඳවා කොත්පලදවා එමවිහාරයෙහි බොහෝ පිළිමගෙවල් ජරාවාස හරවා අනිකුදු මායාරජයෙහි දෙමළුන් නැසූ බොහෝ විහාර පියවි කරවා නැවත ලක්දිව මහසඞ්ඝයා රැස්කොට බොහෝ දවසක් අසමඟිවූ සඞ්ඝයා සමඟි කොට මළුකම් කරවා තුන්රජයෙහි සියළු සඞ්ඝයාටම නොවරදවා අටපිරිකරදී සද්දවසක් මළුකම් පූජා කරවා පන්පොත් දෙමළුන් නැසූහෙයින් සූත්‍රාභිධර්මවිනය සංඛ්‍යාත සුවාසූදහසක් ධර්මස්කන්ධයට සුවාසූදහසක් මසුරන් පුදා ගම ගම කුලියට පොත් ලියනසේ නියෝගකොට අකුරු කරණ සඞ්ඝයා ප්‍රත්‍යයනිසා දුක්නොගන්නේයයි මා ගෙදොරටම සිඟාවඩනේයයි ආරාධනා කරවා වැඩිවැඩි දහස්ගණන් සඞ්ඝයාට දවස්පතා දන්දී මහස්ථවිරාදී ස්ථානාන්තර ප්‍රාප්තනෙනට දවස් පතා දන්වසුන් තබාදී බොහෝ සඞ්ඝයාට අකුරු කරවා තෙරබණ නිසබණද අස්වා ස්ථානාන්තරප්‍රාප්ත කොට මෙසේ ශාසනොපකාරිව අමුතුකතිකාවත කුදු කරවා බොහෝ ලොකශාසනොපකාරකරමින් සතරඅවුරුද්දක් රජකෙළේය.

158. ඉක්බිති ඒරජහුගේ අතිජාතපුත්‍රවූ පණ්ඩිතපරාක්‍රමබාහු මහරජානෝ රජපැමිණ අතුරුනොහැර මහවතුරුසේසතුරුව පසළොස්තැනැක කඳවුරු බැඳ සතළිස් අවුරුද්දක් බලාත්කාරයෙන් හුන් නොයෙක් දහස්ගණන් දෙමළුන්හා යුදකොට ජයගෙණ සියළුලක්දිව එක්සත්කොට දඹදිව කීර්ති පතුරුවා තමන්ගේ රජගෙට නුදුරුතෙන විජයසුන්දරාරාමනම් දළදාගෙයකුදු කරවා බෙලිගලවැඩහුන් දළදාපාත්‍රාධාතූන්වහන්සේ

ගෙන්වා එහිවඩා දළදාසාමීන් වැඩහිඳිනා මිණිරුවන වසා සිටිනාසේ අනඟි අනඟි රුවනින් අතුරුනැතුව විසිතුරු රුවන්කරඬුවක් කරවා ඒවසා සිටිනා පන්දහසක් ඝණරණින් පන්ලක්‍ෂයක් අගණා ඝනරන්කරඬුවක් කරවා එවසාසිටිනාසේ පස්විසිදහසක් රිදීයෙන් පන්ලක්‍ෂයක් අගණා රිදීකරඬුවක් කරවා දළදාසාමීන්ට පූජාකොට නොයෙක් රතනයෙනුදු පුදා පියරජහුද සාදාගතනුහුණු සිංහල මහවන්නි තමන්හුන් පොලම හිඳ සාදා නොයෙක් රටවල් ගෙණ ලක්දිව සිංහල බලපිරිස් රැස්කොට ඒ ඒ දිගින් සිංහල මහසෙන් මෙහෙයා යුද්ධයට පටන්ගත්හ, එකල පොලොන්නොරුආදී තන්හී කඳවුරුබැඳ සතළිස් අවුරුද්දක් බලාත්කාරයෙන් වාසයකළාවූ මාඝරාජය ජයබාහුයයි දෙමළ. රජුන් දෙදෙනාගේ සතලිස්දහසක් පමණ දෙමළ මලල මහසෙනග ගෙණ ඒ ඒ තැන රඳාලිය නොහී ඔවුනොවුන් හා මනත්‍රණය කොට සිංහලයෙහි රඳාලීමෙක් බැරිය සියරට යම්හයි කියා ඇත් අස් මුතු මැණික් රජඔටුනු බිසෝවරුන්ආදී සිංහලයටහිමි අනඟි අනඟිවූ කෙලගණන් වස්තුව ගෙණ නික්ම කඳවුරෙහි පූර්ව වාසලයයි පශ්චිම වාසලින් නික්ම ගොස් රජුගේ පිණින් රටමැදවැද රජුගෙන්, ගිය සිංහල මහ සෙනඟට හසුව සම්පත්තිය පාවාදී ජීවිතයද මුලොච්ජිනනව රජුගේ චිත්තාශීයද සාදා දුන්හ. එතැන්හී ලද සැපතෙහි පටන් සිංහලයෝ ධනෛස්වරවූහ, මෙසේ පරදේශින් සාදා සිටිකල්හී තමන්ට එකොළොස් වන්නෙහි බෞද්ධයම්හයි කියා ලක්‍ෂගණන් තඩවම්බුනම්වූ විසකොහොල් ගෙණ සජීසේනාවක්ෂෝ ඒ ඒ නොටින්බැස ලක්දිව ගලාගෙණ ගිනිසෙන ගියමග දියසෙන ගැසුවාසේ නැවත ලක්දිව නසන්ට පටන්ගත් චන්ද්‍රභානුනම් රජුහා ජාවකමහසෙනගහා නොයෙක් යුදකොට මරා එහුබැඳ මෙසේ මලලයුද්ධය ද්‍රවිඩයුද්ධය ජාවක යුද්ධය යනාදිවූ නොයෙක් යුදකරවා සිරිලක පරසතුරන් සාදා ජයගෙණ ඒකාතපත්‍රකොට සතරසංග්‍රහ වස්තුවෙන් ජනරංජනය කෙරෙමින් දැහැමෙන් රජකරණුයේ දවස්පතා පන්සිල් පොහොය අටසිල් සමාදන්ව මහාසාර පොහොයේ මහසඟණට මහදන්දී එදවස් රාත්‍රි බණ ඇසීම්ද තලතෙල් එල ගිතෙල් උරුලැතෙල් කපුරේනැයි මෙසේ පාන් සතරක් දොළොස් අවුරුද්දක් රාත්‍රිදිනයෙහි නොකඩකොට පවත්වා එකනම්ඇති සුවඳමල් දවස්පතා ලක්‍ෂයක්ද නොයෙක් පූපා පූපයෙන් දළදාවසුන් සතරක්ද පවත්වා ලක්දිව්වැස්සන් ලවා තුන්මසක් මුළුල්ලෙහි දළදාපූජා කරවා රජතෙම සුවඳපැනින්

ඉස්සෝද නහා අමුකපුරෙන් පාන්ලක්‍ෂයක් පුද තෙමේ අටසිල්සමාදන්ව දළදා ප්‍රාතිහාර්‍ය්‍ය දක්නාපිණිස ඒරජ තමාගේ හස්තතලනැමැති පද්මයෙන් වඩා සිටිකල්හි දළදාස්වාමීන් වහන්සේ රජුගේ හෙළු ඇසිපිය ඔසවා නොලනඇසිල්ලෙහි ආකාශයට පැනනැඟී ජීවමාන බුද්ධරූපය මවා සියලඟින් සවනක්රැස් විහිදුවා මුළුනුවර ඒකාලෝකකොට කිසියම් පෙළහරකින් රජුසන්තෝස කරවා ආකාශයෙන් බැස නැවත හස්තතලයෙහි පෙනී ගියසේක.

එකල්හි ඒදුටු රජ චක්‍රරත්නය ලත් සක්විතිරජක්හුමෙන් අතිශයින් සන්තුෂ්ටව ශ්‍රීවර්ධණපුරප්‍රවරාදී නානාස්ථානවල විසිතුරු විහාරකරවා මහසඞ්ඝයා එහි වස්වා සිවුපසදනයෙන් උපස්ථානකොට කපුයෙහිපටන් එකද කඨිනසිවුරු අසූවක් දී මාහැඟිවූ විල් නඞකේතලා භිංකාරාදිවූ නොයෙක් ශ්‍රමණ පරිෂ්කාර සාද පිළිගන්වා බුදුන්ගේ ශ්‍රීපාදපද්මය දකිම්යි සිතා සමණල යනුයේ පදිවෙල්පාය වල්ගම්පායාදිවූ තමන් ඇරිඇරි ඉඩමෙහි විහාරකරවා ගම්බිම් කෙත්වත් දාසිදස් ගව මහිසාදින්ද පුද ගම්පොලපටන් ඇලකඳුරුආදී දුර්ගනස්ථානයෙහි හස්ත්‍යස්වාදීන් ගෙණයනාපරිද්දෙන් හේදඹු ලවා මාර්ගීය සරහා ගොස් ශ්‍රීපාදය වැඳ අතිශයින් සතුටුව ලක්දිව ඒ ඒ ස්ථානයෙහි අම්බලම් කරවා තමන්ගේ පිතෘ කාලිඞ්ග විජයබාහු රජු ආදහන කළ අත්තනගල් විහාරයෙහි මහ දාගැබක් කරවා එහිද දෙමහල් වටදාගෙය තුන් මහල්කොට කරවා තුන්මහල් අටස්දාගෙයද කරවා එහිම නොයෙක් දහස් ගණන් රහතුන්වහන්සේ වාසය කළ භූමියෙහි තුම් මහල් ප්‍රාසාදයක් කරවා එහි වාසය කරන්නාවූ බොහෝ භික්‍ෂූන්ට චීවරාදී සිව්පසය නිරන්තරයෙන් තබාදී ඒ ඒ තන්හි ප්‍රමාදවිහාරිව වසන දුස්සීල විපන්නයන් ශාසනයෙන් පහ කරවා ශාසණය ශුද්ධකොට දහස්ගණක් මහසංඝයා බොහෝ මහණගණයා අයනැන් කියවා මේආදී ප්‍රමාණාතික්‍රාන්තලෝවැඩ සසුන්වැඩ කරමින් බොහෝ කාලයක් රජසිරිවිඳ නිජපුත්‍රවූ විජයබාහුකුමාරයින්ට රාජ්‍යය පාවාදුන්හ.

159. ඒපරාක්‍රමබාහු රජහුපිත් බෝසත්විජයබාහු රජ අවුරුද්දක් රජකෙළේය.

160. ඔහුමල් මහා භුවනෛකබාහු රජ යාපවුනුවර කරවා බොහෝ තුනුරුවන්ට සත්කාර කරමින් එකොළොස් අවුරුද් දක් රජකෙළේය.

161. ඒරජ ඇවෑමෙන් බෝසත් විජයබාහුරජ පිත් පරාක්‍රමබාහුනම් රජ යාපවුනුවරින් පාඬිරටට ගෙණගිය දළදා තුමූම එතරගොස්

වඩාගෙණවුත් පොලොන්නොරුනුවර දළදාගෙයි වඩා පූජා කෙරෙමින් මහසඟනට දන්වැටතබා බොහෝ ලෝකශාසනෝපකාරිව රාජ්‍යය කෙළේය

162. ඒරජඇවෑමෙන් මහාභුවනෙකබාහු රජ පිත් කුරුනෑගල් නුවර දෙවෙනි වත්හිමි භුවනෙකබාහුනම් රජව එම නුවරට පොළොන්නරුවෙන් දළදාසාමින් වඩාගෙණවුත් මහත්පූජා පවත්වා බොහෝ ග්‍රාමාරණ්‍ය විහාරාදිය කරවා මහසඟනට මහත් සත්කාර කරමින් රජකෙළේය

163. ඒරජ ඇවෑමෙන් එම මහරජානන්ගේ ඇතිජාත පුත්‍රවූ කුරුණෑගල පණ්ඩිතපරාක්‍රමබාහු රජ දළදාසිරිතෙහි කීලෙස දළදාසාමින්ට උදාරතර පූජෝත්සව පවත්වා සියනමින් බොහෝ ග්‍රාමාරණ්‍ය විහාරකරවා මහසඟවස්වා උපසථාන කෙරෙමින් මහණෑහළුපැවිදි කරවා පන්සියපණස්ජාතකයන් හෙළුබසින් ලියා සඟමැද කියවා පිරිසිදු කරවා ලක්දිව බෝ කරවා අප්‍රමාණව තුනුරුවන් පිදීමෙන් දැහැමෙන් රජකෙළේය

164. ඒරජුඇවෑමෙන් එමනුවර රජකළ වන්නි භුවනෙකබාහුය
165. විජයබාහුය යන දෙරජුන් විසින් තුනුරුවන්පුදා රජකළහ

166. ඉක්බිති ගම්පොල ගංගාපුරශ්‍රී පුරාධිවාසී සතරවෙනි භුවනෙක බාහුමහරජ දවස සිදුරුවානානුවර ලංකාතිලක මහවිහාරාදී බොහෝ විහාර කරවා බුදුසසුන් උදෙසා අප්‍රමාණ පූජාසත්කාර පවත්වා දැහැමෙන් රජකෙළේය

167–168. ඒරජ ඇවෑමෙන් පරාක්‍රමබාහු රජය වික්‍රමබාහු රජය යන දෙරජුන් දවසද එසේම තුනුරුවන්පුදා රජකළහ

169. ඉක්බිති ජයවර්ධනකෝට්ටේ නුවර රජපැමිනි පස්වෙනි භුවනෙකබාහුරජ පවිටු දුස්සීලයන් නෝරාහැර ගිහිකරවා යහපත් ලජ්ජී මහසඟනට සිව්පස දානයෙන් සංග්‍රහකොට අනෙකප්‍රකාරයෙන් බුදුසසුන් පුදා විසි අවුරුද්දක් රජ කෙළේය

170. ඒරජඇවෑමෙන් එරජුන් සුහුරුබඹු වීරබාහුනම් ඇපානෝ රජසැමිණි දුස්සීලමල පහකොට නිර්මලකිරීමෙන් ලජ්ජීන් වහන්සේට බලයලා බුදුසසුන් බබුළුවා ශ්‍රී දන්තධාතූන් වහන්සේටද නොයෙක් පූජා සත්කාර පවත්වා දැහැමෙන් රජකෙළේය

එකලට බුද්ධවර්ෂයෙන් එක්වාදහස් නවසිය එකුන්සාළිස් අවුරුද්දක් අතික්‍රාන්තවිය

171. ඒ වීරබාහු මහරජානන්ගේ ඇවෑමෙන් එම ජයවර්ධන කෝට්ටෙයෙහි රජපැමිණි ශ්‍රීපරාක්‍රමබාහු රජතුමානෝ අටළොස් වන්නිපත්තුසාද සියලුලක්දිව අයබදු නොටබදු ව්‍යවස්ථාකොට දී ත්‍රිසිංහලයට ඒකච්ඡත්‍රවත්තිව රජකරණුවෝ මහසංඝයාවහන්සේට නිතිබත් තබාදී මස්පතා අටපිරිකරද අවුරුදුපතා කඨිනචීවරද දන්දී පැපිළියානනම් තුන්බෝ පිහිටි මහවිහාරයක් කරවා බොහෝ ගම්බිම් කෙත්වත් පුද පිටකත්‍රය ධර්මය ටීකාඅර්ථකථාසහිතකොට ලියවා තබා දවස්පතා පොත්ලියනසේ ගම් බිම් කෙත්වත් නියමකොටදී, තවද මහියංගන ප්‍රථමචෛත්‍යය හා සිදුරුවානානුවර ලංකාතිලක විහාරයද ගඩලාදෙණි සද්ධර්මතිලක විහාරයද සුවර්ණකර්මාන්ත කරවා මහසඟ රැස්කරවා මහත් පූජාපෙලහැර පැවැත්වීමෙන් උපසම්පද මඞ්ගල්‍යය සිද්ධකරවා ශ්‍රී දන්තධාතුන්වහන්සේ උදෙසා විසිතුරු තුන්මහල් ප්‍රාසාදයක් කරවා නවරුවන්බැඳි මාහැඟි කරඬුවක් ඇතුළුව එසේම විසිතුරු රන්කරඬුතුණක්හා මහත් රිදී කරඬුවක්ද කරවා සුවර්ණ ලිම්පනය කොට දළදාසාමීන් එහි වඩා අප්‍රමාණ පූජා පවත්වා මහසංඝයාවහන්සේට වරින් වර දෙනලද සවිසිදහස් එක්සිය සතළිස්දෙකක් පමණ තුන් සිවුරු පිරිවරකොට ඇති සර්වපරිස්කාර සහිත තුන්දහස් සාරසිය තිස්දෙකක් කඨිනචීවර පූජාකිරීමෙන්ද අනිකුදු තුනුරුවන් උදෙසා අප්‍රමාණ ධනපරිත්‍යාගයෙන් ලෝවැඩ සසුන්වැඩ කෙරෙමින් දෙපණස් අවුරුද්දක් රජකෙළේය.

172. ඒරජ‍ ඇවෑමෙන් ජයවර්ධන කෝට්ටෙයෙහි රජපැමිණි ජයබාහුය ... භුවනෙකබාහුය ... පණ්ඩිතපරාක්‍රමබාහුය ... වීර පරාක්‍රමබාහුය ... විජයබාහුය ... භුවනෙකබාහුය යනාමෙ රජුන් සදෙනාද තමතමන්ගේ සැදැහැ පමණින් තුනුරුවන් පුද නොයෙක් ශාසනෝපකාර කරමින් පරලෝකප්‍රාප්ත වූවාහුය.

178. මෙසේ ජයවර්ධන කෝට්ටෙයෙහි රජපැමිණි රජුන්අතුරෙන් පණ්ඩිතපරාක්‍රමබාහු රජුදවස පෘතුකාලෙක් වෙළඳාම්පිණිසය කියා අවුත් කොළොඹතොටට ගොඩබැස විසූ ප්‍රංගිය යන නම් ඇති මිථ්‍යාදෘෂ්ටීන්ගේ උපද්‍රව ක්‍රමයෙන් වැඩීගිය කල්හි කෝට්ටේනුවර අවසානයෙහි රජකළ භුවනෙකබාහු රජහුගේ ධර්මපාලනම් කුමර රජකිරීමට සහායගනු පිණිස ප්‍රංගීන්ට එක්ව ඔවුන්ගේ සමය ගැන්මෙන් සාසනයට විපක්ෂවූ කල්හි මේරජුදවස කෝට්ටේනුවර නොයෙක් විහාරවල විසූ මහසඟහු එහි නොසිට සීතාවකනුවර ඇතුළුවූ නොයෙක් ස්ථානවල විසූහ.

173. 174 175. 176. 177.

179. එකල සීතාවක නුවර රජකරණ මායාදුනුමහරජානෝද සාදරව මහසඟනට සත්කාර කෙරෙමින් වසනුවෝ ශාසනයට විරුද්ධවූ "පරංගි"න්ට එක්වසිටි භුවනෙකබාහු රජානන්හා නොයෙක්වර යුදකෙරෙමින් ශාසනාධාරව විසූහ.

180. එවකට ශ්‍රී දන්තධාතු රක්ෂාවෙහි නියුක්ත සියනෑකෝරලේ හිරිපිටියේ දිවන රාල යන ආමාත්‍යයෙක් නිරවුල්ව එනුවර නොපවත්නාබව දැන ශ්‍රී දන්තධාතුන්වහන්සේ වඩාගෙණ අප්‍රසිද්ධයෙන් ක්‍රමයෙන් අවුත් සීතාවක නුවරට පැමිණිකල්හි ඒදුටු මායාදුනු මහරජානෝ චක්‍රරත්නය ලදුවාසේ මහත් සන්තෝෂයෙන් මහසෙනඟ රැස්කරවා වඩාආ අමාත්‍යයාට මහත් යසතනතුරු දී අනතුරුව චතුරංගිණි සේනා සමඟින් ශ්‍රී දන්තධාතුන්වහන්සේ එම නුවරින් වඩාගෙණ ගොස් වනදුර්ග ගිරිදුර්ගාදියෙන් සුරක්ෂිත සපරග්‍රාමරට දෙල්ගමුවිහාරයෙහි විසිතුරු දළදාමන්දිරයක් කරවා දළදාසාමින් එහිවඩා සාදර පුදපැවැත්වීමෙන් සුරක්ෂිතව රක්ෂාකළහ. මෙසේ කෝට්ටේ නුවර සීතාවකනුවර උඩරට සෙන්කඩගලනුවරද රාජවංශානුගත රජදරුවෝම වෙන්වෙන්ව රජකෙරෙමින් උඩරටින් ඇතැම් කලෙක අයබදුදී එක්වීමෙන්ද ඇතැම් කලෙක අයබදු නොදී විරුද්ධවීමෙන්ද මෙසේ තුන්කොටසක්ව රජකරණ කල්හි ශ්‍රී බුද්ධවර්ෂයෙන් දෙදාස්අසූපස්වෙනි වර්ෂයෙහි උඩරට කට්පුළුබද සෙංඛණ්ඩශෛලාභිධාන ශ්‍රීවර්ධනපුරයෙහි රජපැමිනි වික්‍රමබාහුමහරජානෝ සතරසංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කරමින් රජකරණුවෝ තමන් වසන රජගෙට දකුණුදිග බුදුන්ගේ ශාරීරිකධාතු වඩා දාගැබක් බදවා එහිම ශිලාස්ථම්භ හිඳුවා කරණලද උළුසෙවෙනිඇති දෙමහල් පොහෝගෙයක් සහිත උපොසථාරාමය ඇතුළුවූ නානාස්ථානවල අසූසයක් සංඝාරාම කරවා එහි වසන මහසඟනට සිව්පසයෙන් උපස්ථාන කෙරෙමින් පන්දහසක් රාත්‍රිබණ පවත්වා පිටකත්‍රය ධර්මයට සැටදහසක් වස්තු පරිත්‍යාග කිරීමෙන් තිස්දහසක් පත්ඉරු ලියවා එසියඅසූනමක් බුද්ධප්‍රතිමාරූප කරවා එසියසතළිසක් පමණ ධාතුකරඬු කරවා, තවද සිය නුවරින් නික්ම එකදම මහියංගන චෛත්‍යස්ථානයට ස්වකීය පාදබලයෙන්ම ගොස් බොහෝ සුවඳ මල්ආදියෙන් පුදා වන්දනා කිරීමෙන්ද එසේම සමනලටද එකදගොස් වට පසලොස්රියන් හා උස පස්රියන් පමණවූ ප්‍රදීපාධාරයෙක තෙල් කළ සියයක් වත්කොට කරණලද ප්‍රදීපපූජාව සහ නොයෙක් පූජාපවත්වා වන්දනා කිරීමෙන්ද හැරම්ටිපානය යනාඤන සත්සියඅසූවක් ශෛලමය සෝපාන කරවා පින්

රැස්කිරීමෙන්ද, තවද ගැටඹේ තොටේ ගංගාතීරයෙහි බොහෝ ගෙවල් කරවා තුන්රජයෙන් මහසංඝයා රැස්කොට මහදන් පවත්වා තුන්සිය පණස්පස්නමක් උපසම්පදා කරවා සාතිරේක දෙදස් එක්සියඅසූවක් සිවුරුපූජාකොට පස්ලක්ෂ අසූපන්දහසක් ධන වියදමින් මෙසේ නොයෙක් පින්කම් කෙරෙමින් බුදුසසුන් බබුලුවා දැහැමින් රජකෙළේය.

එකල සීතාවකනුවර රජකළ මායාදුනුමහරජානෝද නොයෙක් වර කෝට්ටේනුවර වැසියන්සමග යුදකෙරෙමින් දානාදිපින්කම් කරමින් විසූහ.

181. එකල එම මහරජානන්ගේ කුමාරතෙම වැඩිවියපැමිණ සවකීය පියමහරජානන් මරා රාජසිංහනම් රජව තමාගේ බලපරාක්‍රමයෙන් ලංකාව එක්සත්කොට ගෙණ සීතාවකනුවර වසනුයේ එක්දවසෙක සංඝයාට ආරාධනා කොට දන්දී අවසානයෙහි ස්වාමිනි මම පිතෘඝාතක පාපය කෙසේ නසම්දැයි කියා මහතෙරුන්අතින් විචාල කල්හි මහතෙරහු විසාරදව බණවදාරා මහරජ! කළ පාපය නැතිකරන්ට නොහැක්කේයයි කීකල්හි දණ්ඩකින්පහළ සර්පයෙක්මෙන් රජකිපී සිවභක්තිකවූ මිථ්‍යාදෘෂ්ටිකයන් අතින් විචාළේය, ඔව්හු රජහුගේ සිත්ලෙස කීවචන අසා ඔවුන් කෙරෙහි පැහැද චිරකාලානුගත උතුම් සම්‍යක්දෘෂ්ටිය හැර අළුගා මිථ්‍යාදෘෂ්ටි ගෙණ බුද්ධශාසණයට විරුද්ධව බොහෝකලකපටන් අවිච්ඡින්නව පැවැති පොත් පත් හා මහාසළුවිරාදී මහසංඝයාත් නසා සමණල උපදනා ලාබන් ආඬින්ට පමුණුවාදී රාජපරම්පරානුගත රන්රිදීආදී බොහෝ වස්තු නොගත හැකිසේ භූමිගත කරවා විනාශ කොට අධර්මයෙන් රජකොට අවීචියෙහි උපන්හ.

මේරජුදවස ලක්දිව ශාස්ත්‍ර ධර්ම පොත්පත් ආදියහා ශාසණකෘත්‍යයන් නැතිවිය.

182. ඒ රජ ඇවැමෙන් ගම්පලනුවර රාජවංශයෙන් පරම්පරානුගත මහපිනැතියෙක් ඒරජඅවුලෙන් උඩරට නොහිඳැහි කොළඹට පැමින එහිදු නොසිට ගෝවයට ගොස් එහි කලක්වැස කල්බලා නැවත ලක්දිවට අවුත් ශ්‍රී බුද්ධවර්ෂයෙන් දෙදස් එක්සිය පන්තිස්වෙනි වර්ෂයෙහි උඩරට ශ්‍රී වර්ධනපුරයෙහි ( ප්‍රථම ) විමලධර්මසූර්‍ය්‍යමහරජානෝය යන නමින්ප්‍රසිද්ධව රජසිරිපැමිණ ගම්පල රාජවංසපරම්පරානුගත පින්වත් බිසෝකෙනෙකුන් අග්‍ර මහේසිකාකොට මහත් සන්තොසින් තුනුරුවන් පුදමින් වසනුවෝ සපරග්‍රාමරට වැදල්ගමුවිහාරයෙහි වැඩහුන් දළදා සාමින් වඩාගෙණ වුත් තමන් වසන රජගෙට නුදුරුව මාහැඟි

දෙමහල් ප්‍රාසාදයක් කරවා දළදාසාමින් එහිවඩා නොයෙක්පූජා ව්‍යවස්ථා කොට එහිපවත්වා අප්‍රමාණ කුසලරාසි වර්ධනයෙන් යෙදී වසනුවෝ සියළුලක්දිව ගණපූරණයට සෑහෙනතරම් සිල්වත් උපසම්පදා සංඝයා නැත්තෙන් රක්ඛඞගදෙශාධිපති මහරජානන්ට මාහැඟි පඬුරු පාක්කුඩම් හා ශ්‍රී සන්හස්ද ශ්‍රමණ සාරුප්‍යචීවරාදී පරිසකාර වසතුන් සාද අමාත්‍යයන් යවා නන්දිචක්කය චන්‍ද්‍රවිලාසය යන මහාස්ථවිර දෙදෙනා වහන්සේ ප්‍රධානකොට අතිරෙක දසවර්ගික භික්ෂුසංඝයා වඩා ගෙණවුත් ශ්‍රීවර්ධනපුරාසන්නවූ පුසපාරාම විහාරයෙහි වඩා හිඳුවා උපස්ථාන කෙරෙමින් ගැටඹේ තොටේ උදකුක්ඛෙප සීමායෙහිදී ශ්‍රී බුද්ධවර්ෂයෙන් දෙදාස් එක්සිය සතළිස්වෙනි වර්ෂයෙහි උපසම්පදා මඞගල්‍යය සිද්ධකරවා බොහෝ කුලදරුවන් පැවිදිකරවා දානාදී පින්කම් කෙරෙමින් දෙළොස් අවුරුද්දක් දැහැමෙන් රජකෙළේය.

183. ඒ රජ ඇවෑමෙන් ශාසනයෙහි පැවිදිව සිටි එමමහරජානන්ගේ මලනුකෙනෙක් සිවුරුහැර සේනාරතන මහරජානෝය යනනමින් රජසිරි පැමිණ සාදරව දානාදිපින්කම් කිරීමෙන් ජ්‍යෙෂ්ඨභ්‍රාතෘභූත රජතුමන්ගේ කුමරුවන් රක්ෂා කිරීමෙන් එම මහේසිකාවම අගමෙහෙසුන් කොට රජකරණ කල්හි යට කියනලද ක්‍රමයෙන් කොලම්බතීර්ථයෙහි වෙළඳාම් කිරීමෙන් පදිංචිව සිටි ප්‍රංගිය යන මිථ්‍යාදෘෂ්ටිහු ක්‍රමයෙන් උත්සන්නව පාතරට ඒ ඒ තැන කොටුබැඳ සතර සත්කෝරලය සහ ඒ ඒ රටවල් අත්පත්කොටගෙණ උඩරටට සමීපවූහ, ඒකල්හි දළදාසාමින් වඩාගෙණ ගොස් මැදමහනුවර ආදී සුරක්ෂිත ස්ථානවල වඩාහිඳුවා පුදසිරිත් කරණසේ නියෝග කොට රාජකුමාරවරුන් සහ අග්‍රමහේසිකාදීවූ අන්තඃපුරයද රාජපරම්පරාගත රාජවස්තූන්ද නොහැර ගෙණ ශ්‍රී වර්ධන පුරයෙන් නික්ම සේනාරතන මහරජානෝ මිහිඟණට ගොස් එහි මහියංගණ චෛත්‍යස්ථානයට නුදුරුවූ රාජමන්දිරයෙක්හි වසමින් ප්‍රථම චෛත්‍යය වැඳ පුදා ලෝකශාසනදෙක වර්ධනයට නිසි උපාය සොයමින් විසූහ.

එකල්හි සතුරු සේනාව ඌවරටටද අවුත් මහවැලිගඟින් එතරව ඒ ඒ තැන කොටු බැඳ නැවත ශ්‍රී වර්ධනපුරයටත් අවුත් එහි දේවස්ථාන බුද්ධස්ථානාදියෙහි නිර්භීතව විසූහ, ඒ නොබෝ දවසක් ගියතැන නුවර විසූ සතුරුසේනාව ඔවුනොවුන්ම කලහ වීමෙන් ඒ ශ්‍රී වර්ධනපුරය ඇර ගොස් ගඟින්එතරව ගන්නොරුව ආදී ස්ථානවල බලකොටු බැඳගෙණ විසූහ.

එකල්හි මිහිඟුණාව වසන සේනාරතන මහරජහු නිසා මහබිසෝ බණ්ඩාර යන අදහසින් නාමාන්තරයක්ඇති අග මෙහෙසුන් කුස පිළිසිඳ මනා නක්ෂත්‍ර යෝගයකින් මහත් පින්බල පරාක්‍රම ඇති රාජකුමාරයෙක් උපන්හ, එදවස් රාත්‍රියෙහි සතුරුසේනාවගේ ප්‍රධානතෙම පූර්වදිගින් කදෙක්‍රිමියෙකු පමණ ගින්නක්නැඟී ක්‍රමයෙන් මහත්ව කොළඹ කොටුවට පැමිණ සියළු කොටුව දා විනාසවගියා සිහිනෙන් දැක මහත් භයට පැමිණියේය, එදවස්ම කුමරුවාගේ පින්බෙලෙන් ශ්‍රී වර්ධනපුර සමීපයෙහි සිටි සතුරුසේනාවෝ භයපත්ව නුවර සමීපයෙහි නොසිට ගියාහුය, ඒ කුමාරතෙම පෙරඩමස සඳසේ ක්‍රමයෙන් වැඩිවිය පැමින ක්‍රීඩාභූමියෙහිදීම මහත් බලපරාක්‍රම ඇතිබව ප්‍රකාශකොට සිංහසමානවික්‍රමඇතිව රාජසිංහ කුමාරයයි නමින් ප්‍රසිද්ධවිය, සේනාරතන මහරජානෝද නිජපුත්‍රවූ රාජසිංහ කුමාරයන්හා ජ්‍යෙෂ්ඨ භාතෘපුත්‍ර විජයපාලය කුමාරසිංහය යන රජකුමරුවන්ද ගෙණ නැවත උඩරට ශ්‍රී වර්ධනපුරයටම අවුත් නමන් සනාතක ගිරිදුර්ගාදියෙන් පරික්ෂිප්තවූ මාතලය හා ඌවරටද උඩරටද යන මේ රට තුණ කුමාරවරුන් තුන්දෙනාට වෙන් වෙන්ව භාරකොට දී රජ කුමරුන් තුන්දෙනාම වැඩිවර්ධන වනතුරා රක්ෂාකොට දානාදි කුසලධර්මයන් කිරීමෙන් දෙතිස්අවුරුද්දක් රාජ්‍යය කර පර ලෝකප්‍රාප්තවූහ.

184. ඒ රජ ඇවෑමෙන් රාජසිංහාදී රජතුන්නමම එක්ව ගන්නොරුව අඹතැන්න ඇතුළුවූ නොයෙක් තැන්වල කොටුබැඳ විසූ ප්‍රංගිසේනාවහා යුදපටන්ගෙණ නොබෝ දවසකින්ම උඩරට ජයගෙණ නැවත තුන්රජයටම අධිපතිව රාජසිංහරජ යයි රජපැමින පාතරටද ඒ ඒ තැන අතුරුනැතිව කොටුබැඳ විසූ සතුරන් හා යුද්ධකොට සියළුම කොටු බිඳදමා සතුරු වසන් එහුබඳවා මුහුදුබඩ කොටු වලටම රැස්ව සිටිකල් හී මුහුදෙන් රැක යුද්ධකරණපිණිස බෙනාවියට සන්හස්යවා ඕලන්දක්කාර සේනාවක් ගෙන්නාගෙණ දියෙන් ගොඩින් රැක යුද්ධකිරීමට පටන්ගෙණ මුහුදුබඩ සියළුම කොටුත් බිඳ හරවා සතුරු ප්‍රංගිසේනාව දුරුකොට නැවත ලංකාවට මුරජාමපිණිස ඕලන්දක්කාර සේනාව සිටුවා නිරුපද්‍රකොට තුන්රජයෙහි මහසෙනඟ පිරිවරා මෙලකවැසි නොයෙක් ජන සිත් පුරා සතුවුකර සන්තොසින් පිනපිනා අසුරසංග්‍රාමයෙන් ජයප්‍රාප්තවූ සුරේන්ද්‍ර ලීලාවෙන් ස්වකීය පුරප්‍රවේසව පෙර දේවස්ථාන බුද්ධස්ථාන සනාතකව තුබූ ගම්බිම් කෙත්වත් ඒ ඒ ලෙසම පමුනුවා දී මහසෙනෙවිරත් අදිකාරම් දෙපත්තුවද

සතර දිසාවද භාණ්ඩාගාර තනතුරුද තොටමුනවල් සහ සෙසු රටවල්ද ඒ ඒ ලේකම්ද මුහන්දිරම්ද සතර මණ්ඩිගයද සතර කූරුවද ආදිවූ සියළුම සථානාන්තර ව්‍යවසථා කොට තුනුරුවන් පිදීමෙන් බුදුසසුන් හොබවමින් ශ්‍රීවර්ධනපුරයෙහි දෙමහල් දළදාගෙයක් කරවා දළදාසාමින් එහි වඩා රන් රුවන් වස්ත්‍රාභරණ ග්‍රාමක්ෂෙත්‍රාදී නොයෙක් පූජා පැවැත්වීමෙන් දෙපණස් හවුරුද්දක් රජකොට පරලෝකප්‍රාප්තවූහ.

185. ඒරජ ඇවෑමෙන් එම මහරජානන්ගේ අනුජාතපුත්‍රවූ රාජකුමාරයෙක් විමලධර්මසූර්‍ය්‍ය මහරජානෝය යන නමින් රජසිරිපැමින දානාදි පින්කම් කිරීමෙන් වසතුවෝ සියළු ලක්දිව සාමණේර ගණනක්මුත් එකද උපසම්පදා නමකුත් නැති හෙයින් පලමුසේම පඬුරුහා ශ්‍රීසන්හස්ද ශ්‍රමණ සාරුප්‍යවූ බොහෝ පරිසකාරයන්හා සිවුරු දෙපන්සියයක්ද යවා රක්ඛංග දෙසයෙන් සන්තානසථවිරය ලොග්‍රපුගල සථවිරය යන මහතෙර දෙදෙනාවහන්සේ ප්‍රධානකොට ඇති තෙතිස් නමක් පමණ භික්ෂූන්වහන්සේලා වඩා ගෙණවුත් පුෂ්පාරාම විහාරයෙහි වඩා හිඳුවා සිව්පසයෙන් උපසථාන කරමින් පෙර සේම ගැටඹේ තොටේ උදකුක්ඛෙප සිමාවෙහිදී බුද්ධවර්ෂයෙන් දෙදාස් දෙසිය හතළිස්වෙනි වර්ෂයෙහි ලංකාවීපවාසි තෙතිස්නමක් උපසම්පදා කරවා ශාසනොපකාරීව සියළු මහසඟණට මහදන් පවත්වමින් දළදාසාමින් උදෙසා විසිතුරු කර්මාන්තයෙන් සොභාමානවූ තුන්මහල් ප්‍රාසාදයක් කරවා රිදී පස්විසිදහසකින් කරඬුවක් කරවා සවර්ණ ලේපකොට මාහැඟි නවරුවන් බැඳ දළදාසාමින් එහි වඩා සුගන්ධ පුෂ්ප දීප ධූපාදීන් හා ආහාර පානවර්ගාදියෙන් හා රන් රිදී මුතු මැනික් වස්ත්‍රාභරණ ග්‍රාමක්ෂෙත්‍ර දාසිදාස හස්ත්‍යසව ගව මහිසාදී අවිඤ්ඤාණක සවිඤ්ඤාණක වස්තු පිදීමෙන් බොහෝ පින්කම් කොට දෙවිසි අවුරුද්දක් දැහැමෙන් රජකෙලේය.

186. ඒ රජ ඇවෑමෙන් එම මහරජානන්ගේ අනුජාත පුත්‍රවූ රාජකුමාරයෙක් ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජය යන නමින් රජසිරිපැමින රජකරණුවෝ තුනුරුවන් උදෙසා පියමහරජානන්දවස පැවැති පුදසිරිත් එසේම පැවැත්වීමෙන්ද මහියංගණ අනුරාධපුර සමන්තකූටපර්වතාදී උතුම්චෛත්‍යසථානවලට ගොස් නොයෙක් පූජා සත්කාර පැවැත්වීමෙන්ද භික්ෂු සංඝයා ඇතිකල පැවිදිලත් සාමණේරනැන් අතුරෙන් උපෙෂසථාරාම වාසිවූ අසරණ සරණ සරණංකරාභිධාන සාමණෙරයන්වහන්සේ ලජ්ජී පේසල ශික්ෂාකාමිසේකැයි දැනඇඳින ශබ්ද



National Library & Documentation Centre

ශාස්ත්‍ර සද්ධර්මාගමයට සහායව බොහෝ පොත්පත් දෙවා සිව්පස යෙන් වඩවඩා සංග්‍රහ කොට මෙම සාමණේරයන්වහන්සේට ආරාධනා කොට ග්‍රන්ථ එකොලොස්දහසකින් ප්‍රතිමණ්ඩිතවූ සාරසංග්‍රහ නම් ධර්මප්‍රකරණය හා මහාබෝධිවංශ සන්නයද හෙළුබසින්කරවා භෛසජ්‍යමංජූසාවටද අමුතුසන්නයක්කරවා පැවැත්වූහ, තවද භාණ්ඩාගාරයෙන්ම වස්තුදී ධර්මප්‍රකරණයන් ලියවීමෙන්ද රන්රුවන් මල්පහන් ආදී නොයෙක් වස්තු පරිත්‍යාගයෙන්ද දළදාසාමින් පුදා ජීර්ණව තුබූ දෙමහල් දළදා ගෙය එසේම දෙමහල්කොට කරවා දෙතිස් අවුරුද්දක් රජ කෙළේය.

187. ඒ රජ ඇවෑමෙන් රාජ්‍යය පරිපාලනයට යෝග්‍ය ස්වකීය කුමාරයෙකු අවිද්‍යමාන බැවින් එම මහරජානන්ගේ අග්‍ර මහේසිකාවන්ගේ කණිෂ්ඨ භ්‍රාතෘවූ රාජකුමාරයෙක් ශ්‍රීවිජය රාජසිංහනාමින් රජ පැමින ශ්‍රී වර්ධනපුර වසනුවෝ ත්‍රිවිධරත්න ගුණානුස්මරණයෙන් තුනුරුවන් වැඳ පිදීමෙන් හා ඇතුළු නුවරද පිටනුවරද ඒ ඒ තන්හි දෙමහල් තුන්මහල් ධර්මශාලා කරවා මාහැඟි ධනපරිත්‍යාගයෙන් ධර්මපූජා පවත්වාලීමෙන්ද උතුම් සද්ධර්මය කියවා ධර්මශ්‍රවණය කිරීමෙන්ද ස්වකීය ශ්‍රී වර්ධනපුරයෙහි පුෂ්පාරාමවිහාරාදී නා නා ස්ථානවල ශ්‍රමණ සාරුප්‍යවූ සේනාසන කරවා යටකියනලද ලජ්ජී පක්ෂයට මුල්ව සිටි සරණංකරාභිධාන සාමණේරපාදයන් හා තදනුගත බොහෝ ශිෂ්‍යගණයාත් එහිවස්වා චීවරාදී චතුර්විධ ප්‍රත්‍යයෙන් සංග්‍රහකිරීමෙන් මෙම සාමණේරපාදයන්ට ආරාධනා කොට අභිනව සතර බණවරසන්නය ලියවීමෙන්ද, තවද මහොත්සව යෙන් දළදා පූජාවකුදු කරවා ග්‍රාමක්ෂෙත්‍ර හස්ත්‍යශ්වාදී අනේක ප්‍රකාර පූජාවස්තුවෙන් පුදා අසාරවූ කාය ජීවිතාදීන් සාරත්ව යට පමුනුවාලීමෙන්ද ශ්‍රීදන්තධාතු මන්දිරාදී ලක්දිව නොයෙක් විහාර චෛත්‍යස්ථානවල නොහැර එකදම පහන් පූජාවක් කරණලෙස නියමකොට නුවර පටන් හැමතැන්හිම අලංකාර කොට සරහා ප්‍රදීපාලොකයෙන් ඒකාලොක කරමින් එදවස් හිම සත්ලක්ෂ අනූදහසක් පමණ පහන් පූජාවෙන්ද තුන්කෙළ තෙතිස් දහසක් පමණ මල්පූජාකිරීමෙන්ද අතිකුදු සුගන්ධ පුෂ්ප දීප ධූපාහාර පානවර්ගාදී නොයෙක් පූජා පැවැත්වීමෙන්ද තවද උපසම්පදාව සිද්ධකොට සාසනාභිවෘද්ධිය කරණ පිණිස මාහැඟි පඬුරු හා ශ්‍රීසන්හස් ආදිය භාරකොට දී අමාත්‍යයන් දෙශාන්තර යවා තවද දළදාසාමි වඩනාසේ රක්තනීලමණි මුක්තාදී මාහැඟි රුවන් බැඳ අඩදෙරියන් ප්‍රමාණවූ ස්වර්ණරන් කරඬුවකුදු කරවනුවෝ ඒ කර්මාන්තය නොනිමිකල්හිම කුම්වූ පරිද්දෙන්ම අටවෙනි වර්ෂයෙහි පරලොකප්‍රාප්තවූහ.

188. ඒ‍රජ ඇවෑමෙන් එම මහරජානන්ගේ අග්‍රමහෙසිකාවන්ට භාතෘභූත පරමවිසුද්ධ බුද්ධාදී රත්නත්‍රයාධාර අසදෘශාතිගම්භීර ප්‍රවරොදාර කුසලබල පරාක්‍රමාදියෙන් සමන්විතවූ රාජකුමාර කෙනෙක් ශ්‍රී බුද්ධවර්ෂයෙන් දෙදාස් දෙසිය අනූවෙනි වර්ෂයෙහි ශ්‍රීලඞ්කා රාජ්‍යශ්‍රී පදප්‍රාප්තව කීර්තිශ්‍රීරාජසිංහරජය යනනමින් ප්‍රසිද්ධව දාන ප්‍රියවචන අර්ථචර්‍ය්‍යා සමානාත්මතාය යන සතර සඞ්ග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කෙරෙමින් රාජ්‍යශ්‍රී අනුභවකරනුවෝ ජිනවර ශ්‍රී දන්තධාතූන්වහන්සේ උදෙසා බත් පැන් මල් පහන්ආදී නොමඳ පුද පිදීමෙන්ද බුද්ධපුත්‍රවූ සඞ්ඝයා උදෙසා චීවරාදී චතුර්විධ ප්‍රත්‍යයන් පුද කිරීමෙන්ද ලංකාවාසී ජනසමූහයා කුසල ධර්මයෙහි යොදලීමෙන්ද අසාධාරණවූ රාජ ධර්මයෙන් යෙදී වසනුවෝ එවකට ලජ්ජීපෙසල සික්ෂා කාමීවූ ඇතැම් සාමණේර ගණනක් හැර පැවිදිවෙස් ගෙණ බුදුන් විසින් ගර්හිතවූ කෘසි වනික්කර්මාන්ත නක්ෂත්‍ර වෛද්‍ය කර්මාදී අකර්තව්‍යයන් කිරීමෙන් ගෘහස්ථාමාත්‍යයන්සේ රාජාමාත්‍ය සේවනයෙන් විහාරගණනායකත්වයට පැමිණියන් හා අවශේස එබඳු නොයෙක් අලජ්ජී සාමණේරයන්ම මිස සියළුම ලක්දිව එකද උපසම්පද නමකුත් නැතිනිසා ස්‍යාමිඳදෙශාධිපති ධාර්මික මහරජානන්ට මාහැඟි පඬුරු හා ශ්‍රීසන්හස්හා ශ්‍රමණසාරූප්‍ය නොයෙක් පූජාභාණ්ඩයන්ද පණ්ඩිත අමාත්‍යයන්ට භාරකොට දී ශ්‍රීබුද්ධ වර්ෂයෙන් දෙදාස්දෙසිය තෙයානූවර්ෂයෙහි පිටත්කර ස්වා එම ධාර්මික මහරජරානන් විසින් එවන ලද ප්‍රවර උපාලි මහාස්ථවිරයන්වහන්සේද ආයුෂ්මුනි අනුතෙරුන්වහන්සේද මහානාම තෙරුන්වහන්සේද බ්‍රහ්මජෝතිය මහාපුඤ්ඤය චන්දසාරය සාරවන්දය මණිජෝතිය චන්ද්‍රජෝතිය ඉන්ද්‍ර සුවණ්ණිය බ්‍රහ්මස්වරය යසදින්නය සුවණ්ණිය ධර්මජෝතිය යස ගුණ්ය යනභික්ෂූන්වහන්සේලා ඇතුළුව අතිරේක දසවර්ගී භික්ෂු සංඝයාවහන්සේ ලක්දිවට වඩාගෙණ අවුත් ඉෂ්ටිකාවර්ජදනාලංකෘත කොට අභිනව කරවනලද පුෂ්පාරාම විහාරයෙහි වඩාහිඳුවා උපස්ථාන කෙරෙමින් ශ්‍රීබුද්ධ වර්ෂයෙන් දෙදාස්දෙසියඅනූසවෙනි වර්ෂයෙහි උපසම්පද මංගල්‍යය සිද්ධකරවා නැවත නැවතත් උපසම්පද කරවාලීමෙන් තුන්හවුරුද්දක් ඇතුළත සත්සියයක් උපසම්පද කරවා තුන්දහසක් පමණ සාමණේරකරවා සියළුශාසණාභිවෘද්ධියට මුල්ව සිටි විමලසිලාලංකෘත අලෙපවර්ජනාදී ප්‍රවරාමිත තපොගුණ ගණාභරණ විභූසිතවූ වැලිවිට සරණංකර ස්වාමිපාදයන් සංඝරාජ ස්ථානාන්තරයෙහි පිහිටුවා එමස්වාමින්ගේ ධර්මානෙතවාසීවූ ප්‍රධාන ශිෂ්‍ය සමූහයා සුදුසු සුදුසු ස්ථානාන්තර වලට පමුනුවාලීමෙන් ථෙරසම්මුති දෙවා එතැන්පටන් අවුරුදුපතා උපසම්පද මංගල්‍යය සිද්ධ

කිරීමෙන්ද අවුරුදුපතා මහසඟ වස්වසවා මහගඟවතුරක් මෙන් මහදන්දෙමින් කෙළින්සිවුරු අටපිරිකර දීමෙන්ද නානාස්ථානවල විසිතුරු විහාරාරාමකරවා නොයෙක් කප්‍ය භාණ්ඩ සමග සඟ සතුකොට පිළිගන්වා ග්‍රන්ථවිදර්ශණ ධුරවය පුහුණු කරවනසේ නියම කොට සිව්පසයෙන් උපස්ථාන කිරීමෙන්ද එකද උපසම්පදානමකුත් අවිද්‍යමානව තිබූ ලක්දිව තමක්දවස නොයෙක් දහස්ගණන් භික්ෂූන් ඇතිකරවා ඒ සංඝයාට ප්‍රත්‍යයෙන් කලාන්ත නොව ශබ්දශාස්ත්‍ර ධර්මවිනය ධර වන ලෙසට චතුර්විධ ප්‍රත්‍යය ප්‍රදානය කිරීමෙන්ද පිටකත්‍රයෙහි අවිද්‍යමාන පෙල අටුවා ටීකාදිය ලියවා භාණ්ඩාගාරයෙන් බරපැන් දී පිටකත්‍රය සව ස්ථිරව පවත්වාලීමෙන්ද යනාදි නොයෙක් ලෙසින් තුනුරුවන් පිදීමෙන් ලෝකාසාසනෝපකාරීව වසනකල්හී රාජසිංහ මහරජානන් දවස ලංකා රක්ෂාව පිණිස බෙනාවියෙන් ගෙන්වූ ඕලන්දක්කාර සේනාව මුහුදුබඩ කොටු බැඳගෙණ එතැන්පටන් හවුරුදුපතා නානාදෙශෝත්පනන මාහැඟි පඬුරු ගෙණවුත් දෙමින් පක්ෂපාතව සිට ලංකාවාසීන්ගේ කිසියම් ප්‍රමාදතාවයකින් කිපී ඔවුන් විරුඬව වෙහෙසන්ට වන්හ, එබව පින්වත් මගරජානෝ අසා මහත්රාජාභිමාන උපදවා යුද්ධෝපකරණසහ බලපිරිස් දී අමාත්‍යයන් පිටත්කර යැවූකල්හී ඒනිය අමාත්‍යයෝ නොයෙක් තැන් තිබූ කොටු බිඳදමා යුදකොට සතුරන් මරා නොයෙක් වෙහෙස කරමින් ජයගෙණ කොටු කෝට්ටවල තිබූ සවිඤ්ඤානක අවිඤ්ඤානක වස්තුවත් ගෙන්වාගෙණ ආකල්හී නැවතත් කිපි රවුද්‍රවූ යක්ෂසේනාවක්සේ ජාවකාදී නානාදේශවාසිවූ මහපිරිස් ගෙණ ගොවැණීඅධේරුය යන නොනරම්වූවෙක් විහාරදේවාල අම්බලම් ගොණවු පොත්පත් සිඳ බිඳ දමමින් ක්‍රමයෙන් අවුත් ශ්‍රීවර්ධන පුරයට පැමිණි කල්හී පින්වත් මහරජානෝ ශ්‍රීදන්තධාතුන් වහන්සේද බිසෝවරුන්ද මාහැඟි සාරවස්තුන්ද සවකීය භාතෘභූත උපරජුන් දෙන්නාට භාරකොට වනදුර්ග ගිරිදුර්ගනාදියෙන් සුරක්ෂිත ක්ෂේමස්ථානයකට යවා මහරජානෝ උදාරතර රාජාභිමාන උපදවා රණදක්ෂ සූරවීරාමාත්‍යයන්හා සිංහල මහබලපිරිස් පිරිවරා අසුර සමරවන් දෙවේන්ද්‍රලීලාවෙන් නුවර පැතිරසිටි සතුරුසේනාවට නොයෙක් වෙහෙස කොට තැන්තැන්වල සතුරන් ඝාතනය කෙරෙමින් යුද්ධකරණකල්හී පින්වත් රජතුමානන්ගේ පුණ්‍යානුභාවයෙන්ද ශාසන රක්ෂාවෙහි නියුක්ත දේවතානුභාවයෙන්ද සතුරුසේනාව තැතිගෙණ නොබෝ දවසකින්ම ඔවුන්ගේ ප්‍රධානතෙම උමතුව එහි නොසිට නුවරින් නික්ම සම්පත්තියද දමා විපත්තියට පැමින අනාථ අසරණව දුකින්

තැන් තැන්වල බොහෝදෙන ජීවිතවිනාසයට පැමිණ සමහරක් දිව්රැකි සටකීය කොටුවලටම ගොස් ඔවුනොවුන් එකතුව මන්ත්‍රණය කොට ලංකාධිපති මහරජානන්ගේ ආඥපින් බල ඉතාබෙහෙව කවරෙක්නම් ඉක්මවාදැයි කියා මෙතැන්පටන් අපි පලමුපරිද්දෙම්ම අවුරුදුපතා නොයෙක් පඬුරු පාක්කුඩම් ගෙණ දෙමින් සොඳින් පක්‍ෂපාතව ලංකාවට අමුතු වන සතුරු වියවුල් වලකනපිණිස මුරජාම ඇතිව සිටිම්හයි කියා ලංකාධිපති මහරජානන්ගෙන් අවසරගෙණ පලමුපරිද්දෙන්ම විසූහ.

නැවත පින්වත් මහරජානෝද තමන්ගේ පින්බල ආඥබල සවදේස දේසාන්තරයෙහි පතුරුවා සතුරන් විසින් නැසූ විහාර චෛත්‍ය ප්‍රතිමා සංඝාරාමාදි සියල්ලම පෙරතිබූ පණතික්ම ප්‍රකෘතිකර්මාන්ත කරවා දළදාසාමින්ට සතතයෙන් සුගන්ධ පුෂ්ප දීප ධූප ආහාර පානවර්ගාදින් නොමඳපුද සිරිත් පවත්වමින් අප්‍රමාන කුසලරාසින් වර්ධණය කෙරෙමින්, තව්ද යටකියනලද ශ්‍රීවිජයරාජසිංහ මහරජානෝ දළදා සාමින් උදෙසා කරවන්ට ආරම්භව අඩාලවතිබූන කරඬුව අඩදෙරියන් පමන ස්වර්ණයෙන් කරවා මාහැඟි වෛදූර්යමැණිකක් මුදුනෙහි බඳවා එසිය අටසැටක් පමණ වෛදූර්ය මැනික්ද එසිය එක්සැත්තාවක් පමණ පුෂ්පරාගමැනික්ද අසූපහක් නිල්මැනික්ද හාරදහස්අටසිය අසූවක් රත්මැනික්ද හත්සිය හැත්තෑ අටක්පමණ මුතුයෙන්දැයි මෙසේ මාහැඟි අනේකප්‍රකාර රත්නජාතියෙන් විසිතුරුකොට නිමවා ඒරත්නමය කරඬුවේ තබනුපිණිස ඊට කුඩාකරඬු දෙකක්ද නොයෙක් රත්න කර්මාන්ත කරවා පලමු විමල ධර්මමහරජානන් විසින් රිදී සූවිසි දහසකින් කරවනලද කරඬුවද රන්ගාවා අභිනව කරවනලද සුරෙන්ද්‍ර ක්‍රීටප්‍රතිභාගවූ රත්නමය ඒ කරඬුවට දළදා සාමින්වඩා මාහැඟි රාජාභරණ පිදීමෙන් රන්රිදී මුතුමැණික් ආදි ගනන්දුවූදෙයින් සලක්‍ෂ සැටදහසක් අගණා වස්තු පිදීමෙන්ද නොයෙක් ගම්වර පිදීමෙන්ද අපමණ කුසලරාසි වර්ධණය කරණුවෝ අභිනව දෙමහල් දළදාගෙයක්ද කරවා සුරමන්දිරප්‍රතිභාගවූ අභිනව කරවනලද දළදා මන්දිරයෙහි උපරි ප්‍රාසාදතලගත නානා රත්න කර්මාන්තයෙන් බබලන්නාවූ උතුම් පර්යංක මස්තකයෙහි රුවන්කරඬුතුළට දළදාසාමින් වඩා ශංඛ තාල භෙරි මද්දලාදී පඤ්චාංගික තූර්යනාදයෙන්ද සුගන්ධතෙල ප්‍රජ්වලිත නොයෙක් ප්‍රදීප පන්තියෙන්ද සුමන චම්පක නාග පුන්නාග කර්ණිකාර කේතකී රක්තොත්පල සේතොත්පල රක්තපද්ම සේතපද්ම සිනිද්ද බෝලිද්ද බන්ධුජීවකාදී ජලජ ථලජවූ නානා කුසුමයෙන්ද සඳුන් අගරු දේවදුරු

කළුවැල් කොකුම්ආදී නොයෙක් සුගන්ධද්‍රව්‍යයෙන්ද ඝෘතමධුක
සර්කරාදී මධුරවූ ආහාරපානවර්ගාදියෙන්ද තකෙකෝල තාම්බූල
කර්පූරාදියෙන්ද නානාවිධ විචිත්‍ර වස්ත්‍රාභරණ සානිවිතාන
මහාර්ඝ චීවරාදියෙන්ද හස්ත්‍යශ්ව ගෝමහිස දාසිදාස ග්‍රාමක්ෂෙත්‍රාදි
අවිඤ්ඤාණක සවිඤ්ඤාණකාදී පූජාවස්තූන් නිරතුරුව පුදපුදා
අර්ධමාසයක් මුළුල්ලෙහි අපමන කුසලරාසි වර්ධනය කෙරෙමින්
දළදා දක්වා මෙම පින්කමට රැස්වූ ලක්දිව් වැසි සාමණේර
උපසම්පදා සැම නොවරදවා මහගහවතුරක්මෙන් මහදන්
පවත්වා අවසානයෙහි චීවරාදී ශ්‍රමණ පරිෂ්කාරයන්හා මං
හැඟි පණ්ඩුවස්ත්‍රාදිය පූජාකිරීමෙන්ද අප්‍රමාණ කුසලරාසි
වර්ධනය කළහ.

තවද ශ්‍රීවර්ධනපුරයට පූර්වදිසාභාගයෙහි රමණීය භූමිභාග
යෙක්හි සුප්‍රතිෂ්ඨිතවූ පර්වතයෙන් සිලාකොට්ටයන් ලවා
වඩුනවරියන් උස වැඩසිටිනා ඉරියව්වට සෝභමානකොට
පිළිමවහන්සේ නමක් කරවා රන්පතින්වසා කළුගල් කපා
හිකතිබැඳ සිලාස්ථම්භ අතුරා සංඝයාට ගොපානශ්‍යාදී සර්වගේ
භාවයවයෙන් යුක්තකොට දිව්‍යවිමානයක් මෙන් සොභමා
නවූ දෙමහල් විහාර මණ්ඩපය ඒපර්වතය වසා කරවා මහත්
උත්සවයෙන් නේත්‍රාප්‍රතිෂ්ඨා කරවා චිත්‍රකාරාදීන්ට හස්තිරත්න
ප්‍රදානයෙන් රන්රිදී.වස්ත්‍රාභරණ ගෝමහිසාදී ගණින්දුවූ
දෙයින් දෙලොස්දහස් එක්සියපණහක දේ බරපැන්දී ඔවුන්
සතුටුකරවා ගංගාරාමවිහාරයයි ලදනම් ඇති මෙමවිහාරයට
අරුප්පදල දියගමද යන ගම්වර පුදා එහිසිලාලේඛණයකුදු
කරවා පර්යාප්ති ප්‍රතිපත්තියෙහි සතතාදරවූ භික්ෂුසංඝයා එහි
වස්වා අපමන කුසල රාසි වර්ධනය කළහ.

තවද නරේන්ද්‍රසිංහ මහරජානෝ කරවාවිසූ ඒ කුණ්ඩසාලා
භිධාන සාබාපුරයෙහි නාලිකෙරොද්‍යානයෙහි රමණීය භූමි
භාගයෙක්හි සෝභමාන විහාරයක් කරවා ධාතු ජිනබිම්බ
එහි වඩා ග්‍රාමක්ෂෙත්‍රාදීය පුදා සියළුපූජාවිධි අඛණ්ඩව පවත්
වනසැටියට සලස්වා බොහෝ පින්රැස්කිරීමෙන්ද, තවද සීතා
වක රාජසිංහ මහරජතෙමේ පියරජහුමරා ලෝසසුන් නසා
මිථ්‍යාදෘෂ්ටිගෙණ සමනල ශ්‍රීපාදයට උපදිනා ලාභසත්කාර
මිථ්‍යාදෘෂ්ටිකවූ ආඬින්ට පමුණුවා දුන්තැන්පටන් එසේම
පැවතආ සියළු ලාභය සංඝරාජ මහාස්ථවිරපාදයන්ගේ ශිෂ්‍යා
නුශිෂ්‍ය පරම්පරාවෙන් පර්යාප්ති ප්‍රතිපත්ති වර්ධනය කොට
පවත්වනලෙසට තාම්‍රපත්‍රයක ලියා පමුනුවා කුට්ටාපිටිය යන
මහත්ගමකුදු පූජාකොට නොයෙක් පූජාවිධි නියම කිරීමෙන්
අප්‍රමාණ කුසලරාසි වර්ධනය කළහ.

තවද වලගම්බාහු මහරජානන් විසින් කරවනලද මැද වලවිහාරය කටුකොහොල්හරවා සොභමාන චෛත්‍යකුදු කරවා අංගොඩ යනගමද පූජාකොට නොයෙක් පූජාවිධි කිරීමෙන්ද, තවද දුටුගැමුනුමහරජානන් විසින් කරවනලද රිදීවිහාරය ජරාජීර්ණව තිබෙනසේ දැක සියළු විහාරකර්මාන්ත පූරාණ තැන් මුල්පිස කරවා දුටුගැමුනුමහරජානන් විසින් පළමු පූජාකළ ගම්බිම් වෙනස්ව තිබුනසැටි අසා දැන ඒ සියල්ලම පෙරපරිද්දෙම්ම පූජාකොට මෙමවිහාරයෙහි පුද සිරිත් පවත්වමින් පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති වර්ධනය කරණසැටියට නියමකර අප්‍රමාණ කුසලරාසි වර්ධන කළහ.

මෙසේ ඒ කීර්තිශ්‍රී රාජාධිරාජසිංහ මහරජානෝ ප්‍රමාණාතික්‍රාන්ත කුසලරාසි වර්ධනය කෙරෙමින් පන්තිස් අවුරුද්දක් දැහැමෙන් රාජ්‍යයකොට කම්වූපරිද්දෙන් පරලෝක ප්‍රාප්තවූහ.

188. ඒ රජඇවෑමෙන් එම මහ රජානන්ගේ කණිෂ්ඨ භ්‍රාතෘවූ රාජකුමාරයෙක් ශ්‍රීරාජාධිරාජසිංහ රජය යන නමින් ප්‍රසිද්ධව රජපැමින සතරසංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කෙරෙමින් රජකරණුවෝ තමන් ජ්‍යෙෂ්ඨ භ්‍රාතෘභූත කීර්තිශ්‍රී රාජසිංහ මහරජානන්විසින් දළදාසාමින් උදෙසා නියමකළ පූජාවිධි පෙරපරිද්දෙන්ම අනූනව ප්‍රදානය කරමින් අප්‍රමාණ කුසලරාසි වර්ධනය කරණුවෝ ශ්‍රීදන්තධාතු මන්දිරය හාත්පසින් මනාකොට තෝරණපන්ති පහන්ඇගෑ ධජපතාකාදීන් අලංකෘතකොට එකදා පහන් ලක්ෂයක් පූජාකිරීමෙන්ද භාණ්ඩාගාරයෙන් දහස්ගණන් ධන පරිත්‍යාගයෙන් උපසම්පදා මංගල්‍යය සිද්ධකරවා මෙසේම ධනපරිත්‍යාගයෙන් අවුරුදුපතා මහණ මහළු පැවිදි කරවීමෙන්ද උභයවිහාරගත මහසංඝයාවහන්සේට නිරතුරුව චතුර්විධ ප්‍රත්‍යයෙන් උපස්ථාන කිරීමෙන් අවුරුදුපතා කෙළින්සිව්රු අටපිරිකර දීමෙන් ලක් දිව්වැසි සැමසංඝයාට නොවරදවා කෙළින්සිව්රු දීමෙන්ද ඡන්දස් නිඝණ්ඩු වෛය්‍යාකරණ අලංකාරාදි සර්වශාස්ත්‍රයෙහි නිසප්පත්තියට පැමිණ මහපණ්ඩිත තමන් තුනුරුවන් කෙරෙහි අතිප්‍රසන්නබව මතු නොනසා පවත්වනලෙස අසද්‍රිස ජාතකය හෙළුබසින් කාව්‍යබන්ධනයෙන් බැඳ සකලලංකාවීපයෙහි විපුල කරවා කීර්තිශරීරය පවත්වා ලීමෙන්ද මෙසේ උදාරතර කුසලාධ්‍යාශයෙන් යෙදී ලෝවැඩ සසුන්වැඩ කිරිමෙන් අටලොස් අවුරුද්දක් දැහැමෙන් රාජ්‍යයකොට පරලෝක ප්‍රාප්තවූහ.

189. ඒ රජඇවෑමෙන් එම මහරජානන්ගේ බෑණාවන රාජකුමාරයෙක් අන්ධකාරයෙහි මහගිණිකඳක්සේ පැණනැගී

ශ්‍රීවික්‍රමරාජසිංහ මහරජාණෝය යනනමින් රජපැමින ප්‍රසිද්ධව මහත් පුණ්‍යඉද්ධිතෙජෝ බලපරාක්‍රමාදිය දසදිසානන්තරයෙහි පතුරුවා දන ප්‍රියවචන අර්ත්‍ථචය්‍යා සමානාත්මතා සංඛ්‍යාත සතර සංග්‍රහවස්තුවෙන් ජනරඤ්ජනය කෙරෙමින් රජකරනුවෝ පූර්‍වනරවීරයන් විසින් ශ්‍රීදන්තධාතූන්වහන්සේ උදෙසා නියමකළ නොමද පුදසිරිත් එසේම වඩවඩා කෙරෙමින් අවුරුදුපතා වෙසක්පූජා කරමින් මාහැඟි සිවුරුපිළිදෙවා උපසම්පදමංගල්‍යය කරවීමෙන්ද කාත්තිකපූජාවක්ද ඇසළ කෙළියක්ද යනාදී පූජාවිධි පෙරපරිද්දෙන්ම පවත්වමින් උභයවිභාගගත මහසංඝයාවහන්සේට මහගඟ මහවතුරක් මෙන් චතුර්විධ ප්‍රත්‍යය දනයකරණසේක් මතු සියක්නමකට මහගබඩාවෙන් වියදම් දෙවා පොහොය නොවරදවා මංගල්‍ය මන්දිරයෙහිදී බුදුපාමොක් මහසංඝයාට තමන්ට මේ නිමවන පරිද්දෙන් ප්‍රණීතවූ සූපව්‍යංජන ආහාරපානවර්ගී ඝෘතමධු සර්කරා කිරි දී වෙඩරු ආදී ප්‍රණීතාහාරපානවර්ගාදින් සකස්කොට ශ්‍රීහස්තයෙන්ම දන්දී වළඳවා තදනන්තරව ධර්මාමෘත රසාස්වාදය කෙරෙමින් මාහැඟි සිවුරුපිරිකර පූජාකිරීමෙන්ද පොහොය නොවරදවා ශ්‍රීදන්තධාතු මන්දිරයට එළඹ සුමණ චම්පක වකුල නාග කේතකාදී පුෂ්පපූජා කිරීමෙන් වන්දනමාණනාදීන් ප්‍රමාණාතික්‍රාන්ත කුසලරාසි වර්ධනය කරමින් රාජ්‍යශ්‍රී අනුභවකරමින් වසනසමයෙහි පළමු ශ්‍රීරාජාධිරාජ සිංහ රජතුමන් දවස ඕලන්දක්කාරයින් වසඟවතිබූ පාත රට සහ සියළුම කොටුකෝට්ට ඉංග්‍රීසීන් අත්පත්කොටගෙණ සිට ක්‍රමයෙන් උත්සන්නව උඩරට ශ්‍රීවර්ධනපුරයටත් අවුත් වන්හ, එකල්හී පින්වත්රජතුමාණෝ ශ්‍රීදන්තධාතූන්වහන්සේද අග්‍රමහේසිකාබිසෝ වරුන්ද මාහැඟි රාජවස්තූන්ද ගිරිදුර්ග වනදුර්ගාදීන් සුරක්ෂිතවූ ක්ෂේමස්ථාන වලට යවා මහරජාණෝ උදාරතර රාජාභිමාණ උපදවා සේනාපත්‍යාදි රණදක්ෂ සූරවීරාමාත්‍යයන්හා සිංහලබලපිරිස්ගෙණ අසුරසමරවන් දෙවේන්ද්‍රලීලාවෙන් නුවරපැතිරසිටි සතුරුසේනාවට නොයෙක් වෙහෙසකරමින් යුද්ධකරන්ට වන්කල්හී පින්වත් රජතුමානන්ගේ පුණ්‍යානුභාවයෙන්ද සාසනරක්ෂාවෙහි නියුක්ත දේවතානු භාවයෙන්ද යුද්ධකිරීමෙහි පසුබටවූ සිත්ඇතිව යුද්ධකිරීම් තබා තමතමන්ගේ දිවිරැකගෙණ සවකීය කොටු කෝට්ටවලට යම්භයිකිණ ඉංග්‍රීසිගොල්ල ඔවුනොවුන් මන්ත්‍රණයකොට එපවත්රජහට දන්වා අභයඉල්වා සිටිකල්හී ඊටසතුටුව ප්‍රතිවචන දී නිරායාසයෙන්ම ශ්‍රීවර්ධනපුරයසහ රටවල් අත්පත්කොට ගෙණ නැවත ක්‍රොධනැමැති රාක්ෂසයාවිසින් මැඩපවත්වනලද

සිත්ඇති රජතුමානෝ,

"අමිත්තමපි යො දීනං අත්තනො සරණාගතං
ව්‍යසනෙසවනු ගණ්හාති සවෙ භූපති භූපති"-යනුහෙයින් යමෙක් සතුරුවසිට පසුව බැගෑව සරණාන්වේසි වූයේනම් ඔහු ගේ ඒ ව්‍යසනයෙහි අනුග්‍රහ කෙරේද ඒ රජ්ජුරුවෝ රජ්ජුරුවෝයයි කියා පුරාතනයන් විසින් පසස්නාලද රාජධර්මයද ඉක්මවා සරණාන්වෙසිවූ ඒ ඉංග්‍රීසි සේනාවගේ ජීවිතවිනාසයට පමුණුවා අසුරමථනය කොට ජයග්‍රහණය ලත් ශක්‍රදෙවේන්ද්‍ර විලාශයෙන් සිව්රඟසෙනඟ පිරිවරා ශ්‍රීදන්තධාතුන්වහන්සේ වඩාගෙණවුත් ශ්‍රී දන්තධාතුමන්දිරයට වඩා ශ්‍රී දේහෝපගත මාහැඟි රාජාභරණ හා සමග ග්‍රාමක්ෂෙත්‍ර හස්ත්‍යශ්ව ගවමහිස හිරණ්‍යසවර්ණ මුක්තාමාණික්‍යාදී වස්තුව පුදා ලක්දිව් වැසි උපසම්පදා සාමණේර සෑමසංඝයා නොවරදවා දෙවාරයක්ම මාහැඟි වස්ත්‍ර පූජාකිරීමෙන්ද දළදාසාමින් උදෙසා බත්මල් පහන් ආදි පෙරපැවති පුදසිරිත් වඩවඩා පවත්වමින් උභය විහාරවාසි ධර්මකථිකයන්ට ප්‍රණීතාහාර ඛාද්‍යභොජ්‍යාදියෙන්ද ඝෘතමධු සර්කරාදී භෛසජ්ජ්‍යයෙන්ද උපස්ථාන කරමින් වෙසක්මස මුළුල්ලෙහි තිසක් පමණ සර්වරාත්‍රිමය රාත්‍රිබණ කියවා ධර්මදානය දෙවා හිරණ්‍යසවර්ණාදීන්ද සිවුරුපිළි ආදියද පූජාකිරීමෙන්ද, තවද හවුරුදුපතා කලින්කලට සර්වරාත්‍රිමය ධර්මදාන ප්‍රදානය කරවා හිරණ්‍යසවර්ණාදිය සහ සිවුරු පිළි පූජාකිරීමෙන් ප්‍රමාණාතික්‍රාන්ත කුසලරාසි වර්ධනය කරමින් වසනුවෝ කල්යාමකින් යහපත් කල්‍යාණාධ්‍යාශඇති අර්ථානර්ථ වැඩ අවැඩ දන්නා පණ්ඩිතාමාත්‍යයන්ගේ නොපැලඹීමෙන් දෙහෝ නොහොත් අයෝනිසෝ මනසකාරයෙන් යෙදී ලෝකවාසීන්ට හිංසාපීඩා කෙරෙමින් පෙරපැවැති පණතින් දිසුනුව නොමද අයබදු ගණිමින් තමන් රාජ්‍යයෙහි පිහිටුවීමෙහිද සහායවූ ඉෂ්ටමිත්‍රවූ අමාත්‍යයනුද ඝාතනය කොට ඔවුන්ගේ චිරකාලානුගත ග්‍රාමක්ෂෙත්‍රාදී සියළු වස්තු පැහැරගෙණ රටවල් සහ දිසාවල් වලද සුබිතයන් ධනවිචාරයෙන් හස්තපාද කර්ණ නාසා ඡේද්‍යාදි නොවින්දහැකි නොබැලියහැකි නොඇසියහැකි අතිදරුණු වදබන්ධනයෙන් ජීවිතක්ෂයට පමුනුවා චිරකාලානුගත ධන පැහැරගැණීමෙන්ද ක්‍රමයෙන් අධර්මිෂ්ඨව තුනුරුවන් සතුදෙයද පැහැරගෙණ සිල්වත් ගුණවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ද ජීවිතක්ෂයට පමුනුවා සාසනයටද විපක්ෂව සියළු ලංකාද්වීපය ගිනිගත් ගෙයක්සේ කලකල්හී භයපත්වූ ලංකාවාසීහු පරම්පරානුගත ග්‍රාමක්ෂෙත්‍ර ගවමහිස හිරණ්‍යසවර්ණ දාසිදාස මුක්තාමාණික්‍යාදි සම්පත්තියෙහිද ඒකාත්මිකවූ බන්ධු

මිත්‍ර පුත්‍ර කලත්‍රාදීන් කෙරෙහිද නිරාලයව සරණාන්වේෂීව කෝලම්බතීර්ථයට ගොස්- සාම, දාන, දණ්ඩ, භෙද, යන චතුරෝපාය හා ෂාට්ගුණ්‍යාදී නෛකවිධ යුද්ධප්‍රයෝගයෙහිද දක්ෂ ධෘති සමෘති වීර්‍යාදී අපරිමිත බලපරාක්‍රමයෙන් සමන්විත ජිනශාසනෝදය කාමිවූ "රෙසිඩන්තාභිධාන, ජනරාල්" මහත්මයාට එපවත්කියා එම "ජනරාල්" මහත්මයාගේ නියෝගයෙන් ගරුතර "ගොවැණිඥෝරු" උතුමානන්වහන්සේසහ රෞද්‍රවූ යක්ෂසේනාවක් වැනි ඉංග්‍රීසි සේනාව ගෙණ වුත් ශ්‍රීවර්ධනපුරප්‍රමුඛ සකල ලංකාරාජ්‍යයද චිරකාලානුගත මාහැඟි රාජවස්තූන්ද පාවාදී ලංකාධිපති ශ්‍රී වික්‍රමරාජසිංහ රජානන්ද හසුකොට දුන්හ.

මෙසේ ඒ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමානෝ ධර්මාධර්ම දෙකින් රජකරනුවෝ තමන් රජ පැමිනි වසට අටලොස් වෙනි වස සතුරන් වසඟත්වයට පැමිණ දේසාන්තර ගතවූහ.

---

ශ්‍රී සකරාජවර්ෂයෙන් එක්වාදහස් සත්සිය සතළිස් තුනට පැමිණි මෙම වර්ෂයෙහි පොසොම්මස අවසනවක්නම් තිථියලත් බුදදින මෙදවස සඛදෙසදේශාන්තරාගත යසෝ කීර්ත්තිශ්‍රීන් භ්‍රාජිත ජිනේන්ද්‍ර ශාසනාම්බරෝදිත සරත් චන්ද්‍රබිම්බානුකාරී සර්වගුනනිධි විබජජනාමෙහෝජවිකාශන ප්‍රචුරාර්ක මණ්ඩලායමාන කරුණානීරපූරිත මහාර්ණවාකාරවූ වැලිවිට සරණංකරාභිධාන සංඝරාජ ධානාන්තර ප්‍රාප්ත යතීස්වරයානන් වහන්සේ විසින් ලියවනලද (සුළුරාජවලියයි).

---

මේ වාසගම පොතේ තිබෙන හෙයින් ඉවත් නොකෙළෙමි,

විජයරජු පටන් රජසි[illegible]වෙළට
ඉ ල ක් ක ම් යො දා ඇ ත් තේ සි.